34 වන කාණ්ඩය
6 වන කලාපය

සිකුරාද
1985 මාර්තු 8

EVELYN RUTNAM LIBRARY
134
29/3 8
JAFFNA



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත් කෙටුම්පත :
පළමුවන වර කියවන ලදී

පෞද්ගලික මන්ත්‍රීත්ගේ යෝජනා :
බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීම

ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදිත් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදිත් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත :
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :
සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

දිවිතුර උත්තර පබ්බතාරාම විහාර සංවර්ධන මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :
සලකා බලා තුන්වන වර කියවා සම්මත කරන ලදී

මාවතැල්ල එක්සත් බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :
සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල්තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 34
இல. 6

வெள்ளிக்கிழமை
8 மார் 1985

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினுக்களுக்கு வாய்மூல விடைகள்

இலங்கை வெளிநாட்டு வேலை வாய்ப்புப் பணியகம் சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

தனியங்கத்தினர் பிரேரணைகள்
பௌத்த வழிபாட்டுத் தலங்களைப் பாதுகாத்தல்

இலங்கை உரோமன் கத்தோலிக்க அதிமேற்றிராணியார், மேற்றிராணியார்கள் (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம் மதிப்பிடம்பெற்று நிலைக்குழு 'ஏ' க்குச் சாட்டப்பட்டது

பல்கலைக்கழக மகளிர் இலங்கைச் சம்மேளனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
பரிசீலிக்கப்பட்டு மூன்றும்முறை மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

திவிதுர உத்தர பப்பதாராம விகாரை அபிவிருத்திக் கழகம் (கூட்டிணைத்தல்) சட்டமூலம் :
பரிசீலிக்கப்பட்டு மூன்றும்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

மாவனல்லை எக்ஸத் பௌத்த சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம் :
பரிசீலிக்கப்பட்டு மூன்றும்முறை மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை

---

Volume 34
No. 6

Friday
8th March 1985

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT

(Uncorrected)

## PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT BILL :
Read the First time

PRIVATE MEMBERS' MOTIONS
Preservation of Buddhist Shrines

ROMAN CATHOLIC ARCHBISHOP AND BISHOPS OF CEYLON (AMENDMENT) BILL :
Read a Second time, and allocated to Standing Committee "A"

SRI LANKA EDERATION OF UNIVERSITY WOMEN (INCORPORATION) BILL :
Considered, read the Third time, and passed as amended

DIVITURA UTTARA PABBATHARAMA VIHARA SANWARDENA MANDALAYA (INCORPORATION) BILL :
Considered, read the Third time, and passed

MAWANELLA EKSATH BAUDDHA SAMITIYA (INCORPORATION) BILL :
Considered, read the Third time, and passed as amended

ADJOURNMENT MOTION

2–A 082484–2,750 (85/03)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
# PARLIAMENT

1985 මාර්තු 8 වන සිකුරාදා
வெள்ளிக்கிழமை, 8 மாச் 1985
*Friday, 8th March, 1985*

*පූ. භා. 9.30 ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9.30 a.m.* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNE) *in the Chair.*

# විගණකාධිපතිගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
# AUDITOR-GENERAL'S REPORT

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I present the First Instalment of the Report of the Auditor-General under Article 154 (6) of the Constitution on the Accounts of the Government of Sri Lanka for the Financial Year 1984.

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the First Instalment of the Report of the Auditor-General be printed."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
# PAPERS PRESENTED

A Direction issued by the President under Section 20 (1) (*a*) of the Universities Act, No. 16 of 1978.– [*Mr. M. Vincent Perera, on behalf of the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways and Minister of Emergency Civil Administration.*]

Annual Report and Accounts of the State Pharmaceutical Corporation of Sri Lanka for 1980.– [*Mr. M. Vincent Perera, on behalf of the Minister of Health.*]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
## மனுக்கள்
# PETITIONS

චන්ද්‍රා කරුණාරත්න මහතා (නියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමා)
(திரு. சந்திரா கருணரத்ன — இராசாங்கப் பிரதி அமைச்சர்)
(Mr. Chandra Karunaratne–Deputy Minister of State)

I present a petition from Mr. A. T. I. M. Perera of No. 142, Ambegamuwa Road, Nawalapitiya.

මෙරිල් කාරියවසම් මහතා (අගලවත්ත)
(திரு. மெரில் காரியவசம் — அகலவத்த)
(Mr. Merril Kariyawasam–Agalawatta)

I present a petition from Mr. K. S. Perera of Palatota, Kalutara.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Hon. Member for Wellawaya (*Pause*) Not here.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

පහත සඳහන් පෙත්සම් හය මම ඉදිරිපත් කරනවා.

(i) පන්නිපිටිය, පරණ පාරේ, අංක 34 දරන ස්ථානයේ පදිංචි සී. එම්. බී. මහින්දදස මහතාගෙන් ලැබුණු පෙත්සම.

(ii) බොරලැස්ගමුව, රත්නතිස්සයේ, අංක 249 දරන ස්ථානයේ පදිංචි පී. එල්. යූ. කරුණාරත්න මහතාගෙත් ලැබුණු පෙත්සම.

(iii) ගම්පහ, ඉහළයාගොඩ, "සිංගර්" හි පදිංචි ඩී. ආර්. චන්ද්‍රපාල මහතාගෙත් ලැබුණු පෙත්සම.

(iv) තුඹගොඩ, ගංගොඩවිල, අංක 628/12 දරන ස්ථානයේ, "ධම්මික" හි පදිංචි කේ. ඒ. එච්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

(v) අවිස්සාවේල්ල, අකරවිට, තම්බිගොඩ පදිංචි කේ. ජී. ජෝත්සිංඤා මහතාගෙත් ලැබුණු පෙත්සම සහ

(vi) කෝට්ටේ, මාදිවල, ප්‍රගතිපුර පාරේ, අංක 30/38 දරන ස්ථානයේ පදිංචි එල්. සිරිපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Hon. Member for Kalawana (*Pause*) Not here.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කිරීම යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்கள் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Public Petitions Committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினுக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

ඩී. ඒ. සිරිසේන මහතා : සේ. අ. අ.
திரு. டீ. ஏ. சிறிசேன : ஊழியர் சேமலாப நிதி
MR. D. A. SIRISENA : EPF

41/85

3. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake–Galle)

ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1984 මැයි 5 වැනිද විශ්‍රාම ගිය ගාල්ලේ වරාය අධිකාරියේ කම්කරු, අංක ST 255 හිමි, ඩී. ඒ. සිරිසේන මහතාගේ අර්ථසාධක අරමුදල් ගෙවීම් ප්‍රමාද කරනු ලබන බවත්, ඔහු සියළු ලියකියවිලි භාරදී ඇති බවත් එතුමා දන්නේද?

(ආ) ඔහුට එය ගෙවත්තේ කවදද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එම්.ඊ්. දහනායක මහතා]

**தேசிய பாதுகாப்பு அமைச்சரும் பிரதிப் பாதுகாப்பு அமைச்சரும் ஆனவரைக் கேட்ட வினு;**

**(அ) ST255 ஆம் இலக்கத்தைக் கொண்டவரும் காலி துறைமுக அதிகார சபைத் தொழிலாளியாக இருந்து 1984 மே 05 இல் ஓய்வு பெற்றவருமாகிய திரு. டி. ஏ. சிரிசேனவின் சகாய நிதிக் கொடுப்பனவு தாமதப்படுத்தப்படுகின்றது என்பதனையும் அவர் தேவையான ஆவணங்கள் அனைத்தையும் சமர்ப்பித்து விட்டார் என்பதனையும் அவர் அறிவாரா?**

**(ஆ) அவருக்கு எப்பொழுது இது கொடுபடும்?**

asked the Minister of National Security and Deputy Minister of Defence :

(*a*) Is he aware that the payment of the P.F. of Mr. D. A. Sirisena, labourer, Port Authority, Galle, No. ST 225, who retired on 5th May, 1984 is being delayed and that he has submitted all documents ?

(*b*) When will it be paid to him ?

**ලලිත් ඇතුලත් මුදලි මහතා (ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා)**

(திரு. லலித் அத்துலத் முதலி—தேசிய பாதுகாப்பு அமைச்சரும் பிரதிப் பாதுகாப்பு அமைச்சரும்)

(Mr. Lalith Athulath Mudali – Minister of National Security and Deputy Minister of Defence)

(අ) 1984. 05. 07 වන දින විශ්‍රාම ගිය ඩී. ඒ. සිරිසේන මහතාට ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් පිළිබඳ ලියකියවිලි ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අංක එෆ්ඩී/පිඑෆ්/15/පිඑල්/463 හා 1984. 06. 06 වන දින දරණ ලිපිය මඟින් කම්කරු කොමසාරිස් වෙත යවන ලදී.

(ஆ) අංක කේ 20760/157230 දරණ චෙක්පතින් අර්ථසාධක අරමුදල් වශයෙන් රු. 36,156.73 ක් (රුපියල් තිස්හයදස් එකසිය පනස් හයයි ශත හැත්තෑතුනක්) 1985 02. 01 වන දින අංක එස්ටී 255 හිමි ඩී. ඒ. සිරිසේන මහතාට ගෙවා ඇත.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

4 වන ප්‍රශ්නය

**ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යෞවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා)**

(திரு. காமினீ அத்துக்கோறல — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்புப் பிரதி அமைச்சர்)

(Mr. Gamini Atukorale–Deputy Minister of Youth Affairs & Employment)

මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මාසයක කාලයක් අවශ්‍යයි.

*ප්‍රශ්නය මතු දිනෙදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*விஞ்ஞை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 1.

**එම්. විත්සන්ට් පෙරේරා මහතා**
(திரு. எம். வின்சன்ட் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Public Administration and Minister of Plantation Industries, I ask for one month's time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනෙදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*விஞ்ஞை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කේ. පී. සුගතදස මහතා : මරණ පාරිතෝෂිකය**
**திரு. கே. பீ. சுகததாச : மரணப் பணிக் கொடை**
**MR. K. P. SUGATHADASA'S DEATH GRATUITY**

36/85

2. **සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)**
**(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)**
(Mr. Sarath Muttetuwegama–Kalawana)

ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) වී. වැ. අංක 1275/පී.5 යටතේ විශ්‍රාම වැටුප් හිමි, 3 කණුව, අම්පාර පාරේ, සියඹලාණ්ඩුවේ පදිංචිව සිටි, කේ. පී. සුගතදස මහතා (ලිපිකරු II 'අ') අම්පාර වාරිමාර්ග කාර්යාලයේ සේවය කරමින් සිටියදී මියගිය බව එතුමා දන්නවාද?

(ஆ) ඔහු 1977 සිට 1979 දක්වා මුතුකණ්ඩිය වාරිමාර්ග කාර්යාලයේ සේවය කරද්දී, එම කාර්යාලයේ තිබූ උපකරණ අඩුවීමක් සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් හෝ 1979/80 ගබඩා සම්පරීක්ෂණයක් නොපවත්වා මියයාමෙන් පසු ඔහුගේ මරණ පාරිතෝෂිකයෙන්, රු. 17,969.40 ක්, අයකර ගැනීමට නියෝග කර තිබේද?

(ඇ) යටෝක්ත හාණ්ඩ, එවකට මුතුකණ්ඩිය වාරිමාර්ග කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී වශයෙන් කටයුතු කළ අය විසින් කාර්යාලයෙන් ඉවත් කරගෙන ගොස් ඇති බවට, සුගතදස මහතා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂතුමා වෙතද, පිටපතක් සහයමින් 1979. 03. 14 වෙනි දිනැති ලිපිය මඟින් පැමිණිලි කර ඇතත්, ඒ ගැන පරීක්ෂණයක් පවත්වා නොමැත්තේ මන්ද?

(ඈ) ඔහුගේ මරණ පාරිතෝෂිකයෙන් යටෝක්ත මුදල, අඩුකර ගැනීම අසාධාරණ බැවින්, ඔහුගේ සම්පූර්ණ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හා වැත්දෑ අතත්දරු වැටුප්, ඔහුගේ භාර්යාවට හා දරුවනට ගෙවීමට අප්‍රමාදව කටයුතු කරනවාද?

(ඉ) නො එසේ නම් ඒ මන්ද?

**කාණි, කාණි අපිවිරුත්ති අමාත්‍යතුමා සහ මහාවලි අපිවිරුත්ති අමාත්‍යතුමානන්වරුන්ගෙන් ඇසූ ප්‍රශ්නය :**

**(අ) சியம்பலாண்டுவ, அம்பாறை வீதியிலுள்ள 3 ஆம் கட்டையில் குடியிருந்தவரும் வி. வே./1275/பி. 5 இன் கீழ் ஓய்வுதியத்திற்கு உரித்துடையவருமான திரு. கே. பீ. சுகததாச (எழுதுவினைஞர் 11அ) அம்பாறை நீர்ப்பாசன அலுவலகத்தில் சேவைசெய்யும் போது இறந்துபோனதை அவர் அறிவாரா?**

**(ஆ) இவர் 1977 ஆம் ஆண்டு தொடக்கம் 1979 ஆம் ஆண்டு வரை முத்துக்கண்டி நீர்ப்பாசன அலுவலகத்தில் சேவை செய்தபோது, இவ்வலுவலகத்திலிருந்த உபகரணங்கள் குறைவு தொடர்பாக ஒழுக்காற்று விசாரணையோ, 1979 ஆம் ஆண்டு தொடக்கம் 1980 வரை களஞ்சிய பரிசோதனையோ நடத்தாமல், இறந்து போன இவரது மரணக் கொடையில் ரூ. 17,969.40 ஐ அறவிட பிறப்பிக்கப்பட்டுள்ளதா?**

**(இ) அப்போது முத்துக்கண்டி நீர்ப்பாசன அலுவலகப் பொறுப்பு உத்தியோகத்தராகக் கடமையாற்றியவர் குறித்த பொருட்களை அப்புறப்படுத்தியதாக, திரு. சுகததாச, நீர்ப்பாசனப் பணிப்பாளருக்கும் பிரதியொன்றினை வழங்கி 79.03.14 ஆம் திகதிக் கடிதம் மூலம் முறைப்பாடு செய்த போதிலும் இது தொடர்பாக விசாரணை நடத்தப்படவில்லையென்பதை அவர் அறிவாரா?**

**(ஈ) அவ்வாறெனில், இவரது மரணக் கொடையிலிருந்து குறித்த பணத்தைக் கழித்தது அநீதியானதெனத் தீர்மானித்து இவருடைய ஓய்வூதிய பணிக்கொடை முழுவதையும் விதவை அநாதைகள் ஓய்வூதியத்தையும் இவருடைய மனைவிக்கும் பிள்ளைகளுக்கும் தாமதமின்றிக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா?**

**(உ) இன்றேல், ஏன்?**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Lands and Land Dvelopment and Minister of Mahaweli Development :

(*a*) Is he aware that Mr. K. P. Sugathadasa, (Clerk, Grade II 'A'), who was resident at 3rd Mile Post, Amparai Road, Siyambalanduwe, and who was entitled to a pension under Retirement Pension No. 1275/P5 died while serving at the Amparai Irrigation Office ?

(*b*) Has a sum of Rs. 17,969.40 ordered to be recovered from his death gratuity in respect of a shortage of equipment in the Muthukandiya Irrigation Office while he was serveng there from 1977 to 1979 regarding which no desciplinary inquiry or a 1979-80 stores survey was carried out before his death ?

(*c*) Why was it that although Mr. Sugathadasa had complained by letter of 14.03.1979, which a copy to the Director of Irrigation, that the aforesaid articles had been removed from the Office by the officer who had been in charge of the Muthukandiya Irrigation Office, no inquiry had been held in regard to that matter?

(*d*) Will he take prompt action to pay the full retirement pension benefits and the Widows' and Orphans' pension to his wife and children as it is unfair to recover the aforesaid amount from his death gratuity

(*e*) If not, why ?

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I answer on behalf of the Minister of Lands and Land Development and Minister of Mahaweli Development. It is a long answer Sir. May I be permitted to table the answer ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Yes, the answer may be tabled.

*සභාමේසය මත තබන ලද පිළිතුර :
சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:
*Answer tabled:*

(*a*) Yes.

(*b*) No. Deputy Director of Irrigation, Moneragala has been requested to hold an inquiry and send a report immediately in connection with the shortage of equipment worth Rs. 17,969.40 at the Irrigation Office, Muthukandiya, which had occurred when Mr. Sugathadasa was attached to that office. The Deputy Director of Irrigation, Moneragala had informed earlier that the above amount should be recovered from the Death Gratuity of Mr. Sugathadasa.

The Death Gratuity application has already been forwarded to the Director of Pensions. Action in connection with the Death Gratuity has been suspended till a final decision regarding the recovery is received.

(*c*) According to the papers available at this office it does not appear that a letter dated 14.03.1979 has been received from Mr. Sugathadasa. However, this is being searched with the help of a copy of the said letter forwarded by his widow along with her letter of September 1984 and not dated.

(*d*) The Death Gratuity application was forwarded to the Director of Pensions on 23.08.1984 subject to the condition that the particulars of recoveries to be made from the gratuity will be informed later.

All the papers required for the Widow's Pension purposes were sent to the Secretary and Accountant of the Widows' and Orphans Pension Fund on 23.08.1984.

(*e*) Not relevant.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 5.

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Deputy Minister of Plan Implementation, I ask for one month's time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*விஞ்வை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 6

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Deputy Minister of Plan Implementation, I ask for one month's time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*விஞ்வை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව : තනි ලක්ෂයේ නැංගුරම් බෝයා ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම

## இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் : "சிங்கிள் பொயின்ற் மூரிங் போய் புறஜக்ட்" க்கு ஒப்பந்தக்காரர்களை தெரிவு செய்தல்

## CEYLON PETROLEUM CORPORATION : SELECTION OF CONTRACTORS FOR SINGLE POINT MOORING BUOY PROJECT

47/85

7. **දිනේෂ් ගුණවර්ධන මහතා** (මහරගම—ලක්ෂ්මන් ජයකොඩි මහතා—අත්තනගල්ල—වෙනුවට)

**(திரு தினேஷ் குணவர்த்தன—மஹரகம—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல—சார்பாக)**

(Mr. Dinesh Gunawardene – Maharagama – on behalf of Mr. Lakshman Jayakody – Attanagalla)

කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) තනි ලක්ෂයේ නැංගුරම් බෝයා ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ කාර්මික කමිටුවට සහභාගි වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන්ගේ නම් සහ සුදුසුකම් එතුමා සඳහන් කරන්නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

(ආ) ඉහළ මට්ටමේ වෙරළාසන්න සමුද්‍ර ඉංජිනේරු විද්‍යා ව්‍යාපෘතියක් අගැයීමට ඔවුන් සතු දක්ෂතාවයත්, වෙරළාසන්න ඉංජිනේරු විද්‍යාව හා යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව විෂයයෙහි ඔවුන් මෙතෙක් ලබා ඇති පළපුරුද්ද හා සුදුසුකමුත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) ඉහත සඳහන් කමිටුව රැස්වූ වාර ගණන හා එස්පීබීඑම් ව්‍යාපෘතියේ ටෙන්ඩර් අගැයීම සම්බන්ධව පැවති එක් එක් රැස්වීමට සහභාගි වූ නිලධාරීන්ගේ නම් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) ඉහත සඳහන් කමිටුව විසින් කැබිනට් මණ්ඩලයටත්, එස්පීබීඑම් ව්‍යාපෘතියේ ටෙන්ඩර් මණ්ඩලයටත්, සංවර්ධන සභා සභාපතිවරුන්ටත් ඉදිරිපත් කරන ලද සියලු වාර්තා එතුමා මෙම සභාවට ලැබෙන්නට සලස්වන්නේද?

(ඉ) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද?

**கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :**

(அ) "சிங்கிள் பொயின்ற் மூரிங் போய் புறஜக்ட்" ( Single Point Mooring Buoy Project ) ஒப் பந்தக்காரர்களைத் தெரிவு செய்யக் கூட்டுத்தாபனத் தொழில் நுட்பக் குழுவில் இடம்பெற்ற, பெற்றோலியக் கூட்டுத்தாபன அதிகாரிகளின் பெயர்களையும் தகைமைகளையும் அவர் கூறுவாரா ?

(ஆ) கரைகடந்த பொறியியலிலும், இயந்திரப் பொறியியலிலும், உள்ள தகைமையையும், இவர்களது முன்னாள் அனுபவத்தையும், நுண்ணிய கரைகடந்த கடல் பொறியியல் கருத்திட்டத்தை மதிப்பீடு செய்யும் இவர்களது திறனையும் அவர் கூறுவாரா ?

(இ) "எஸ்பிபீஎம்" கருத்திட்ட கேள்வி மதிப்பீட்டுக்கான ஒவ்வொரு கூட்டத்திற்கும் சமுகமளித்த அதிகாரிகளின் பெயர்களையும் மேற்படி குழு நடத்திய கூட்டங்களின் தொகையையும் அவர் கூறுவாரா ?

(ஈ) "எஸ்பிபீஎம்" கருத்திட்டத்தின் அமைச்சரவை கேள்விச் சபைக்கும் அபிவிருத்திச் சபைத் தலைவர்களுக்கும் மேற்கூறிய சபை சமர்ப்பித்த சகல அறிக்கைகளையும் அவர் தருவாரா ?

(உ) இல்லையேல், ஏன் ?

asked the Minister of Industries and Scientific Affairs :

(*a*) Will he state the names of officers and their qualifications of the Ceylon Petroleum Corporation who sit in the Corporation's Technical Committee for the selection of contractors for the Single Point Mooring Buoy Project ?

(*b*) Will he state their capacity to evaluate an advanced offshore marine engineering project, their past experience and qualifications in offshore engineering and Mechanical engineering ?

(*c*) Will he state the number of sittings of the above Committee and the names of officers who attended at each meeting of the SPBM project tender evaluation ?

(*d*) Will he make available all reports submitted by the above Committee to the Cabinet Tender Board of SPBM Project and to the Chairman of Development Secretaries ?

(*e*) If not, why ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I answer on behalf of the Minister of Industries and Scientific Affairs. This question may be referred to the Minister of Power and Energy.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 8

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways and Minister of Emergency Civil Administration, I ask for one month's time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

1985.1.8 දින හැන්සාඩ් වාර්තාව : වැඩිපුර පිටපත් සඳහා ඇණවුම

**1985. 1. 8 ஆம் தேதிய ஹன்சாட் : மேலதிக பிரதிகளுக்கான கட்டளை**

HANSARD OF 8.1.1985 : ORDER FOR EXTRA COPIES

71/85

9. දිනේෂ් ගුණවර්ධන මහතා (සිරිල් මැතිව් මහතා—කැලණිය—වෙනුවට)
(திரு தினேஷ் குணவர்த்தன—திரு. சிறில் மத்தில் —சார்பாக)

(Mr. Dinesh Gunawardene on behalf of Mr. Cyril Mathew – Kelaniya)

රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ජනවාරි 8 වැනි අඟහරුවාදා කැලණියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් 1985 ජනවාරි 8 වැනි දින හැන්සාඩ් වාර්තාවේ පිටපත් විසි දහසක් ලබා ගැනීම පිණිස ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට ඇණවුමක් ඉදිරිපත් කළ බවත් එකී පිටපත්වල වටිනාකම ගෙවීමට එම මන්ත්‍රීවරයා එකඟ වූ බවත් එතුමා දන්නේද?

(ආ) මේ ඇණවුම ඉටුකර නැති බව එතුමා දන්නේද?

(ඇ) එකී ඇණවුම ඉටු නොකිරීමට ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට එතුමා උපදෙස් දුන්නේද?

(ඈ) එසේ නම්, එවැනි උපදෙස් දීම සඳහා එතුමාට කිසියම් නියෝගයක් ලැබුණේද?

(ඉ) එවැනි නියෝගයක් නොලැබුණේ නම් එම ඇණවුම ඉටු නොකරන්නේ මන්ද?

(ඊ) එකී හැන්සාඩ් වාර්තාවේ පිටපත් පනස් දහසක් හා මන්ත්‍රීවරයාගේ කථාව අඩංගු පිටුවල පිටපත් තවත් පනස් දහසක් යන සියල්ල සඳහා මන්ත්‍රීවරයා විසින් මුදල් ගෙවනු ලබන එම ඇණවුම භාරගන්නා ලෙස එතුමා රජයේ මුද්‍රණාලයාධිපතිට උපදෙස් දෙන්නේද?

**இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா:**

(அ) 1985 சனவரி 08 ஆந் தேதிய ஹன்சாட்டின் இருபதினாயிரம் பிரதிகள் கேட்டு அரசாங்க அச்சகரிடம் களனிப் பாராளுமன்ற உறுப்பினர் சனவரி 08 ஆந் தேதி செவ்வாய்க்கிழமை அனுப்பாணை ஒன்றைச் சமர்ப்பித்தார் என்பதையும் அப்பிரதிகளுக்குரிய பணத்தைச் செலுத்த ஒத்துக்கொண்டார் என்பதையும் அவர் அறிவாரா ?

(ஆ) இவ்வனுப்பாணை நிறைவேற்றப்படுவதாக இல்லை என்பதை அவர் அறிவாரா ?

(இ) இவ்வனுப்பாணையை நிறைவேற்ற வேண்டாமென அவர் அரசாங்க அச்சகருக்கு அறிவுறுத்தியுள்ளாரா ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஈ) அவ்வாருயின் அத்தகைய அறிவுறுத்தல் வழங்கும்படி அவருக்கு ஏதேனும் கட்டளை கிடைத்ததா ?

(உ) கட்டளை ஏதேனும் கிடைக்கப்பெருவிடின் அந்த அனுப்பாணையை நிறைவேற்றுமைக்குக் காரணம் என்ன ?

(ஊ) இந்த ஹன்சாட்டின் ஐம்பதினாயிரம் பிரதிகளுக்கும் உரையை உள்ளடக்கிய அந்த ஹன்சாட் பக்கங்களில் மட்டும் இன்னுமொரு ஐம்பதினாயிரம் பிரதிகளுக்கும் மொத்தமாக இவ்வுறுப்பினர் பணஞ்செலுத்தவுள்ள இந்த அனுப்பாணையை ஏற்றுக்கொள்ளும்படி அவர் அரசாங்க அச்சகருக்கு அறிவுறுத்துவாரா ?

asked the Minister of State :

(*a*) Is he aware that on Tuesday, 8th January, 1985, M.P., for Kelaniya placed an order with the Government Printer for twenty thousand copies of the Hansard of 8th January, 1985 and that he agreed to pay for the said copies ?

(*b*) Is he aware that this order is not being executed ?

(*c*) Has he instructed the Government Printer not to execute the said order ?

(*d*) If so, did he receive any orders to give such instructions ?

(*e*) If no, orders were received what is the reason for not executing the order ?

(*f*) Will he instruct the Government Printer to accept from him an order for fifty thousand copies of the said Hansard and another fifty thousand copies of only the pages containing his speech for all of which payment will be made by him ?

චන්ද්‍රා කරුණාරත්න මහතා (නියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමා)
(திரு. சந்திரா கருணரத்ன — இராசாங்கப் பிரதி அமைச்சர்)
(Mr. Chandra Karunaratne–Deputy Minister of State)

(*a*) Yes.

(*b*) Yes.

(*c*) I have instructed the Government Printer not to undertake any extra work outside his normal print orders as other urgent work of Government Departments is being delayed.

(*d*) No.

(*e*) Please see (*c*) above.

(*f*) No.

## පණත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ශ්‍රී ලංකා විදේශ සේවාතියුක්ති කාර්යාංශය පනත් කෙටුම්පත
### இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம் சட்டமூலம்
### SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT BILL

"to provide for the establishment of the Sri Lanka Bureau of Foreign Employment and to regulate its powers and duties, to repeal the Foreign Employment Agency Act, No. 32 of 1980 ; and to provide for matters connected therewith or incidental thereto."

*විදේශගත්වන ලද්දේ කම්කරු ඇමතිතුමා වෙනුවට එම්. වින්සන්ට් පෙරේරා මහතා විසිනි. 1985 මාර්තු 21 වන බුහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.*

*தொழில் அமைச்சர் சார்பாக திரு. எம். வின்சன் பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1985 மார்ச் 21 வியாழக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by Mr. M. Vincent Perera on behalf of the Minister of Labour ; to be read a Second time upon Thursday, 21st March 1985 and to be printed.*

## බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීම
## பௌத்த வழிபாட்டுத் தலங்களைப் பாதுகாத்தல்
## PRESERVATION OF BUDDHIST SHRINES

*කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [1983 සැප්තැම්බර් 9.]*

*ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது. வினா— [ 9 செப்டெம்பர் 1983 ]*

*Order read for resuming Adjourned Debate on Question – [9th September 1983.]*

"ලංකාවට ජාත්‍යන්තර කීර්තියක් ලබාදෙන බෞද්ධ සිද්ධස්ථාන වල් බිහි වී යා නොදී ආරක්ෂා කර ගැනීම සඳහා සෑම ග්‍රාම සේවක කොට්ඨාශයක් තුළම ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක බලා ගැනීමට බෞද්ධ භික්ෂූන්ට හැකි වන අයුරු රජය සංඛ්‍යාවෙන් ඇති කොට තබන්නා කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි." [දයාරත්න වලගම්බාහු මහතා.]

"பௌத்த வழிபாட்டுத் தலங்களைப் பாதுகாத்தல்,— விவாதம் ஒத்திவைக்கப்பட்ட விடயம் (செப்டெம்பர் 9, 1983), — "இலங்கைக்குச் சர்வதேச கீர்த்தியைப் பெற்றுத்தருகின்ற பௌத்த வழிபாட்டுத் தலங்களைப் பாழடைய விடாமல் பாதுகாப்பதற்காக எல்லாக் கிராம சேவகர் பிரிவுகளிலுமுள்ள பௌத்த வழிபாட்டுத் தலங்களைப் பௌத்த பிக்குமார் கண்காணித்துக் கொள்வதற்கு இயலும்விதத்தில் அரசாங்கம் பிக்குகளுக்கான இருப்பிடங்களை ("சங்காவாஸ") ஏற்படுத்தி அவைகளைப் பராமரிக்க வேண்டுமென இப்பாராளுமன்றம் கருதுகின்றது." எனப் பிரேரணை கொண்டுவரப்பட்டு எடுத்தியம்பப்பெற்றது." [திரு. தயானந்த வலகம்பாகு]

"That this Parliament is of opinion that the Government should establish and maintain monasteries for Bhikkhus, so that they could look after the Buddhist shrines in every Grama Sevaka Division with a view to saving from dilapidation these shrines which have brought international fame to Sri Lanka.". [Mr. Dayaratne Walagambahu]

*ප්‍රශ්නය යළිත් සභාගතිමුඛ කරන ලදී.*

*வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.*

*Question again proposed.*

ප.ව. 9.39

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වතාවේ රැස්වීම කල් තබන අවස්ථාවේදී මේ රටේ බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා වූ මෙම යෝජනාව පිළිබඳව මා කරුණු ඉදිරිපත් කරමින් සිටියා. එයට අදාළ වන එක් වැදගත් කරුණක් මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම කන්ද උඩරට ප්‍රදේශයේ සිංහල ජනතාවගේ අති මහත් බහුතරයේ බැඳීම්වලින් තමයි, අපේ බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා වුණේ. එම සිද්ධස්ථාන වැඩි දියුණු කර ගැනීමට ඇති අර්බුදයත් පිළිබඳවයි මා එදා කරුණු ඉදිරිපත් කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට ව්‍රිතාන්‍ය පාලනයට යටත් කර ගැනීමෙන් පසු මුළු උඩරට හෙවත් කඳුකරය තමන්ගේ වැවිලි ආර්ථිකයට නතු කර ගැනීම සඳහා ඉංග්‍රීසීන් කළේ ඒ ගම් නියම්ගම්වල ජීවත්වූ ජනතාවට, ඒ ඉඩම්, ඒ ජීවන ප්‍රදේශ සම්පූර්ණයෙන්ම අහිමි කරමින් බලහත්කාරයෙන් ඔවුන්ගේ වතු ආර්ථිකය ඒ ප්‍රදේශවල ගොඩ නැඟීමයි. නමුත් 1974 දී ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මඟින් සහ ඊට පසුව රත්පවුම් වතු ජනසතු කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

ගෙනෙන ලද සංශෝධන පනත මගින් උඩරට පුත්‍රයෙක් හැටියට එද ඒ අමාත්‍ය ධූරය දරූ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ඉංග්‍රීසීන් විසින් ජනතාවගෙන් උදුරා ගත් ඒ භූමිය යළිත් ජාතිය සන්තක කළා. ඒවායේ යම් යම් කොටස් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් විවිධ හේතු මත පෞද්ගලික අයට පැවරීම පිළිබඳව පසුගිය අවස්ථාවේදී මම මතක් කළා. විශේෂයෙන් බෞද්ධ සිද්ධස්ථානයක් ඇති කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට සිදුවූ විපත්තිය පිළිබඳව ඒ අවස්ථාවේදී ඉදිරිපත් කළ කරුණුවලින් — උදාහරණයක් වශයෙන් දක්වූ ඒ කාරණයෙන් — සනාථ වෙනවා, මේ කඳුකර ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථානයක් ඇති කර ගැනීමේදී අද ඇති වී තිබෙන දැඩි විරෝධය මතු වන්නේ කොයි ආකාරයෙන්ද කියා. නියම කරන ලද මුදල් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙව්වාට පසුව හා කරන ලද මැනීම් කටයුතු හමාර කළාට පසුවත් ස්වාමීන් වහන්සේ නමකට ඒ ආයතනය ඇති කර ගැනීමට තිබුණු විරෝධයයි, ඒ. එය සනාථ කරන්නට එවැනිම තවත් උදාහරණයක් ගෙනෙන්නට මම කැමතියි.

කන්ද උඩරට නුවරඑළියේ ධර්මපාල පුර බ්ලැක්පූල් මුඩු බිමේ කොටස් අල්ලා ගැනීම පිළිබඳවයි, ඒ උදාහරණය. ඒ ප්‍රදේශයේත් මේ ආකාරයේම විශාල ව්‍යාපාරයක් කෙරීගෙන යනවා. ඒ පිළිබඳව ලැබුණු ලිපි ලේඛණ මා ළඟ තිබෙනවා. සංස්කෘතික, ආගමික හා අධ්‍යාපනික සංවර්ධනය සඳහා ඒ භූමියෙන් යම්කිසි කොටසක් බෞද්ධ ජන කොටස්වලට ලබා ගැනීමේ අමාරුකමක් තිබෙනවා. නමුත් ඒ ඉඩමින් අක්කර කීපයක් ද්‍රවිඩ ජන කොටස්වල ඕනෑකම අනුව පවරා දී තිබෙනවා. මෙන්න මෙයයි, මෙහි තිබෙන ප්‍රතිවිරෝධය. මේ රටේ පාරම්පරික ජනතාවට නැත්නම් උඩරට ජනතාවට අහිමිවූ තමන්ගේ ඒ අයිතිවාසිකම් ශත වර්ෂයකට හෝ එක හමාරකට පසුව නැවත භුක්ති විඳින්නට ඇති අයිතිවාසිකම ඔවුන්ට අහිමි වන තත්ත්වයක් අද ඇතිවෙමින් තිබෙනවා. බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමට මෙන්ම රැක ගැනීමටත් මේ අන්දමේ ක්‍රියාවලියන් ඉතාම අහිත කර බව කියන්නට වුවමනාවක් නැහැ. ඒ නිසා බෞද්ධ සිද්ධස්ථාන සුරක්ෂිත කිරීමට හෝ එය දියුණු කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක අවශ්‍යතාවයක් ඇති වෙනවා. එයට හේතුව මෙයයි. ශ්‍රී ලංකාවේ අති මහත් බහුතර ජනතාවගේ විශ්වාසය රැඳී ඇති බෞද්ධාගමේ දියුණුව සඳහා එවැනි ක්‍රියා මාර්ගයක් ඇති නොකළොත් උදාවන බේදවාචකය කුමක්දැයි කියන්නට අවශ්‍ය නැහැ.

අපේ රටේ මුළු මහත් සංස්කෘතික ඉතිහාසයේම උරුමය ගොඩනැගී තිබෙන්නේ බෞද්ධ ශිෂ්ටාචාරය මතයි. මානව දයාව සහ ඒ වටා ගොඩනැගුණු ඒ සංකල්පය තෝරා ගෙන වැවත් දාගැබත් කෙත්යායත් ගැන අපි කුමන කතා කීවත්, වැවත් කෙත්යායත් ගැන කතාව ඉතිරි වී දාගැබ නඩත්තු වන්නට පන්සල ආරක්ෂා වෙවී ඒ වටා ගෙතුණු ඒ සංස්කෘතික සිතුම් පැතුම් හා සමාජ ඉදිරි ගමන අද අඩපණ වෙමින් යන බව කියන්නට ඕනෑ. මෑත යුගයේ මේ රටේ ප්‍රභුවරයින් අතර ජීවත් වන තෙන්නකෝන් විමලානන්ද මහතා විසින් කාලයකට පෙර — මේ අර්බුදය ඇති වන්නට කාලයකට මත්තෙන් — පළ කළ " ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය හා සිංහලයාගේ අනාගතය " යන පොත පැහැදිලිව නිදර්ශන ගෙනෙනවා, මේ සංවිධානාත්මක බෞද්ධ හා සංස්කෘතික විනාශය සඳහා කරගෙන යන දේවල් පිළිබඳව.

මේ පොත පළමුවෙන්ම මුද්‍රණය කර තිබෙන්නේ 1970 දී. අද ඇති වී තිබෙන ප්‍රශ්නය පිළිබඳව මේ පොතේ කරුණු දක්වා තිබෙනවා. තෙන්නකෝන් විමලානන්ද මහත්මයා මේ රටේ ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයෙක්. එතුමා පළ කළ මේ පොත මේ කාරණයේදී ඉතාම වැදගත් වෙනවායයි මම හිතනවා. පල්ලේකැලේ වතුයායේ පිහිටා තිබෙන දුම්බර මිටියාවත ගැන කරුණු මේ පොතේ 88 වැනි පිටුවෙහි දක්වා තිබෙනවා. ඒ මුළුමහත් මිටියාවතේ ගොඩනැගුණු සංස්කෘතියට සිදු වේගෙන යන විනාශය ගැන කරුණු මෙහි දක්වා තිබෙනවා. ඒ වටා ගොඩනැගුණු ආගමික පරිසරයට සිදුවේගෙන යන විනාශය ගැන කරුණු දක්වා තිබෙනවා. අද ඒවා පැහැදිලිවම සනාථ වන තත්ත්වයකට පරිවර්තනය වී තිබෙනවා. ඒ නිසා අප රටේ ජාතික, සංස්කෘතික මෙන්ම ආගමික පදනම ආරක්ෂා කරන්න හැකි වේයයි අපට විශ්වාස කරන්න පුළුවන් වන්නේ මෙවැනි යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් පමණයි.

මම මේ සම්බන්ධයෙන් තවත් උදාහරණයක් ගේන්න කැමතියි. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා කළ ප්‍රකාශයක් පෙබරවාරි මස 27 වැනි දින ' අයිලන්ඩ් ' පත්‍රයේ මේ විධියට පළ වී තිබෙනවා.

"Rural Industrial Development Minister S. Thondaman said on Saturday that he or anyone else need not go to Madras or Delhi to seek a solution to the ethnic crisis.

Strengthen the hands of President Jayewardene so that he can implement the fair solution he has in mind he said."

ඒ ඇමතිතුමා තවදුරටත් මෙසේ කියාගෙන යනවා.

"Mr. Thondaman revealed that the TULF General Secretary A. Amirthalingam had indicated on four occasions that he was prepared to accept a solution similar to the Bandaranaike–Chelvanayagam pact. 'Why not snatch that offer and make peace in this country of ours' he implored."

ඒ අවස්ථාවේදී එහි සිටි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කතා කරමින් ඇමතිතුමා මෙසේ කියා තිබෙනවා :

"Turning to the UNP paliamentarians present on the dais he asked. 'why are you asking for my help. My organisation and I have stood by President Jayewardene through thick and thin. I ask the members of the UNP to strengthen his hands. I request you to pass a resolution in the UNP, giving the President full mandate to solve the problem. If you strengthen his hands, I have no doubt he will find a reasonable solution'."

මෙන්න මේ ප්‍රකාශයේ ගැබ් වන එක් දෙයක් තිබෙනවා. 1956 දී බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුව විසින් ඇති කරන ලදුව මේ රටේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මෙන්ම අති මහත් බහුතර ජනතාවගේත් විරෝධය මත ඉරා දැමූ බණ්ඩාරනායක — වෙල්වනායගම් ගිවිසුම ක්‍රියාත්මක කිරීම හොඳය කියන හැඟීමක් ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට යෝජනා කර තිබෙනවා. මේවාගේ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපතිවරයාගේ බලය තහවුරු කිරීමට වෙනම යෝජනාවක් සම්මත කරන ලෙස ඒ ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා.

බණ්ඩාරනායක — වෙල්වනායගම් ගිවිසුම පිළිබඳ ඉතිහාසය මම මේ වේලාවේදී මතක් කරන්නේ ඒ ගිවිසුමට මේ රටේ සිංහල ජනතාවත් සිංහල ජනතාවගේ විශේෂයෙන්ම බෞද්ධාගමේ ආරක්ෂකයන් හැටියට සිටින මහනායක ස්වාමීන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නයත් එද විරුද්ධ වුණු නිසයි. එවකට සිටි අග්‍රාමාත්‍යතුමා එද එම ගිවිසුම පිළිබඳව ඇති වුණු මහජන උද්ඝෝෂණයට හිස නමා එය ඉවත් කළා. ඒ සම්බන්ධයෙන් පළ කරන ලද පොත්පත් ගණනාවක් තිබෙනවා. එද මහජන මතය අනුව ඉවත් කරන ලද අහෝසි කරන ලද ගිවිසුම නැවත ක්‍රියාත්මක කිරීමක් ගැන යම් කෙනෙක් කතා කරන විට අද ඊලාම් රාජ්‍යයක් ඉල්ලන කොටස් විසින් බොහෝම සංවිධානාත්මකව උතුරු නැගෙනහිර ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථාන සම්බන්ධයෙන් ඇතිකරගෙන යන වැඩ පිළිවෙල අපට පැහැදිලිව සිහි වෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවගේ ආරක්ෂාවත්, මේ රටේ ඒකීයභාවයේ ආරක්ෂාවත් රැඳී පවතින්නේ බෞද්ධ සිද්ධස්ථාන වටා ගොඩනැගෙන ආරක්ෂිත වළල්ලක් ක්‍රියාත්මක කළොත් පමණයි. මේ රටේ එකම එක ප්‍රදේශයක්වත් මේ රටේ එකම එක ආගමකට වෙන් කර දී, එසේ නැත්නම් එකම ජන කොටසකට වෙන්කර දී ඒ අයට ඕනෑ ආකාරයෙන් ඒ ප්‍රදේශයේ වැඩකටයුතු ක්‍රියාත්මක කරන්නට අවසර දුන්නොත් එයින් සිදුවෙන විනාශය රාජ්‍යයක් වශයෙන්ම අපගේ විනාශයයි කියන එක පැහැදිලි වෙනවා.

බණ්ඩාරනායක — වෙල්වනායගම් ගිවිසුම තුළ උතුරු නැගෙනහිර පළාත් පමණක් නොව වෙනත් පළාත්ද ඒකාබද්ධ වීමට ඇති අවස්ථාව පිළිබඳව තිබුණු භයානකත්වය නිසයි ඒ ගිවිසුම ඉරා දමන්නට සිදු වුණේ. එම ගිවිසුමට විරුද්ධව එක්සත් ජාතික පක්ෂයේ නායකයන් එද පෙළපාලි ගිය අවස්ථා ගැන මම අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඒ පිළිබඳව පළ කරන ලද පොත්පත් මේ රටේ තවමත් තිබෙනවා. එම ගිවිසුමට තදබල ලෙස විරුද්ධත්වයක් පැනනැගුණු බව ඒ වෙලාවේ ප්‍රසිද්ධ කරන ලද පොත්පත්වලින් ඔප්පු වෙනවා. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද ? අද පවතින තත්ත්වය යටතේත් සිංහල බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කර ගැනීමට පුළුවන් වෙයිද ? අද උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වීගෙන යන, සිදු වී තිබෙන අතවරයන් පිළිබඳව, විශේෂයෙන් සිංහල ජනතාවට සිදුවෙන අතවරයන් පිළිබඳව සාකච්ඡා කිරීම වෙනදටත් වඩා සීමා කර තිබෙනවා. ප්‍රවෘත්ති පත්‍ර මඟින් ඒ පිළිබඳව අදහස් දැක්වීම පුළුවන් තරම් පාලනය කිරීමේ උත්සාහයක යෙදී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම පසුගිය වතාවක නැගූ ප්‍රශ්නයක්ම අද ඊට වඩා ටිකක් පැහැදිලිව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. උතුරු ප්‍රදේශය නැගෙනහිර ප්‍රදේශය වගේම උඩරට ප්‍රදේශය පිළිබඳව සැලකිලිමත් විය යුතුව තිබෙනවා. අද ඇති කරන්නට බලාපොරොත්තු වන උප දිසාපති කොට්ඨාශ අතුව ඇති කරන්නට යන සහාවල් තුළින් මේ රටේ බෞද්ධ සිද්ධස්ථාන සහ සිංහල ජනතාවගේ පාරම්පරික නිජභූම් ඒ ජනතාවට අහිමි වෙන්නට ඉඩ තිබෙනවා නේද ? කන්ද උඩරට ප්‍රදේශයේ මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක වුණොත් එහි ඇතිවෙන බොහෝ උප දිසාපති කොට්ඨාශවල සම්පූර්ණ බලය යන්නේ කාටද ? එහි සම්පූර්ණ බලය ලැබෙන්නේ වෙනත් විටියේ වැඩ පිළිවෙලක් තීර්මානය කරන්නට වැඩ කරගෙන යන මලයකාඩු ව්‍යාපාරයේ නායකයන්ටයි කියන එක අපි අමුතුවෙන් කියන්න වුවමනා නැහැ. පන්විල උප දිසාපති කොට්ඨාශය අරගෙන බලන්න. මේ වගේ උප දිසාපති කොට්ඨාශ කීපයක් බිහි වුණොත් මේ රටේ ආරක්ෂාවට හෝ සිංහල සිද්ධස්ථානවල ආරක්ෂාවට සිදුවිය හැකි අනතුර කුමක්ද ? ඒ නිසා මේ උප දිසාපති කොට්ඨාශ අනුව ඇති කරන්නට යන සහාවල් පිළිබඳව අලුතෙන් කල්පනා කරන්නට කාලපරිච්ඡේදයක් ඇවිත් තිබෙනවා. ඒවායින් ඇතිවෙන ප්‍රතිඵල මොකවාද කියා කල්පනා කර බලන්නට අවස්ථාව ඇවිත් තිබෙනවා. ඒවායින් රටට කුමන විටියේ ආරක්ෂාවක් ඇති විය හැකිද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එක් යෝජනාවක් ඉවත් කර දමා තව යෝජනාවකට අවතීර්ණ වෙද්දී හුහක් දුරට කල්පනා කරන්න ඕනෑ. මේ යෝජනා මගින් දීර්ඝ කාලීන වශයෙන් මේ රට ජාතීන් වශයෙන් බෙදීමකට තුඩුදෙන්න පුළුවන් වෙයිද ? බෞද්ධ සිද්ධස්ථාන වටා ගෙතුණු ජාතික සංස්කෘතියේ ආරක්ෂාවීමක් සිදු වෙයිද ? අපි දන්නවා, සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් මේ රට පිළිගෙන තිබෙන බව. ඒ සිංහල භාෂාව කොදන්නා පිරිසක් අතට මේ කුඩා කොටස්වල බලය යාමෙන් මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව හැටියට නොපිළිගන්නා තත්ත්වයක් ඇති විය හැකි නේද ? මේ රටේ ජාතික සංස්කෘතියට බද්ධ වෙන්නට සූදානම් නැති කොටස් අතට ඒ ප්‍රදේශවල බලය ගියොත් මේ බෞද්ධ සිද්ධස්ථානවල අනාගතයට කුමක් වෙයිද කියන ප්‍රශ්නය ගැන අපි නැවත වරක් සලකා බලන්න ඕනෑ. සුදු අධිරාජ්‍යවාදීන්ගේ සමයේ මුහුණ දුන්නාට වඩා භයානක තත්ත්වයකට ඒ ප්‍රදේශවල සිටින සිංහල බෞද්ධ ජනතාවට මුහුණ දෙන්නට සිදු වේවි. ඒ වගේම තමන්ගේ ආගමික සිද්ධස්ථානවලටත් එදට වඩා භයානක තත්ත්වයක් ඇතිවෙන්න පුළුවන්. අද උඩරට වතුකරයේ ඇති විගෙන යන අර්බුදකාරී තත්ත්වයෙන් අපට ඒ බව පැහැදිලිව පේනවා.

රජය විසින් සිංහල බෞද්ධ ජනතාවට ඉඩම් පවරා දීම පිළිබඳව ඇති විරෝධය අපට පෙනෙන්න තිබෙනවා. එපමණක් නොවෙයි, ඒ ප්‍රදේශවල සිංහල ජනයාට අයිතිව තිබෙන යම් යම් වතු පවා විනාශ කරන්නට ගෙන යන දුවැන්න ව්‍යාපාර ගැන අපට ආරංචි තිබෙනවා. මම එක් පැහැදිලි උදාහරණයක් පමණක් ඉදිරිපත් කරන්නම්. ලීදුල ප්‍රදේශයේ එකම එක සිංහලයෙකුට අයිති වත්තක් තිබෙනවා. අන්න ඒ වත්ත මහා විනාශයකට පරිවර්තනය කිරීම සඳහා දුවැන්න අරගල ගණිතාවක් ඒ ප්‍රදේශවල ඉන්න සිංහල විරෝධී ව්‍යාපාරයේ නායකයන් විසින් මෙහෙයවා තිබෙනවා. ඒ පිළිබඳ ලිපි, ප්‍රකාශන ඕනෑ තරම් මා ළඟ තිබෙනවා. ඒ වත්ත සම්පූර්ණයෙන් කඩාකප්පල්කර, වත්තේ පරිපාලනය අඩපණ කර, නිෂ්පාදනයත් සම්පූර්ණයෙන් අඩපණ කළාට පසුව, ඒ වත්ත මිලයට ගැනීමට යෝජනාවක් පවා ඒ අය විසින් වත්තේ අයිතිකරුවන්ට ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ආදයම්වල විනාශය සිදු වුණත් තමන්ගේ පාඩුව තමන්ට තිබුණාවේ යන පදනම මත ඒ කොන්දේසිවලට යටත්ව වත්ත විකුණන්නේ නැත. වත්ත නිකම්ම තිබුණත් කමක් නැත කියන තීරණය ඒ අයිතිකරුවන් විසින් ගැනීම තිසයි අද ලීදුලේ වත්ත ආරක්ෂා වී තිබෙන්නේ.

මේ ව්‍යාපාර තුළින් මේ සිංහල බෞද්ධ ජනතාවගේ සංස්කෘතියට නැත්තම්, සිංහල බෞද්ධ ජනතාවගේ අයිතිවාසිකම්වලට උදාවෙලා තිබෙන තත්ත්වය ඉතාමත්ම කණගාටුදායකයි. ලීදුල තිබෙන මේ වත්තේ නම, " මැක්ඩප් ගෲප් ". අද ඒ ප්‍රදේශයේ රාජ්‍ය වතුවලට අමතරව සිංහල අයකුගේ අතේ තිබෙන එකම වතුයාය එපමණයි. මම මේ කාරණාව මතක් කළේ මේ රටේ මේ ව්‍යාපාරය තුළින් සිදුවෙගත යන විනාශය පෙන්වා දීමටයි. මම අනික් විනාශයන් පිළිබඳව මෙතැන නැවත වරක් කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. උතුරු ප්‍රදේශයේ බෞද්ධ සිද්ධස්ථානවලට උදාවෙලා තිබෙන තත්ත්වය ගැන, ඒවායේ සිදු වී තිබෙන විනාශයන් ගැන, ඒවා පුනරුත්ථාපනය කිරීම සඳහා අරගන්නට පුළුවන් පියවරවල් කවද ගන්නට පුළුවන් වේද කියන සැකය ගැන මම මේ අවස්ථාවේ කියන්නට යන්නේ නැහැ. යාපනයේ නාග විහාරය විනාශ වීම. තවත් ඒ වාගේ බෞද්ධ සිද්ධස්ථාන ගණනාවක් විනාශ වීම හා මේ රටේ බෞද්ධයන්ගේ වැදගත්ම සිද්ධස්ථානයක් වූ තිරියාය ආදිය ගැනත් විමසා බලන්න අපට යුතුකමක් තිබෙනවා. අද තිරියායට සිද්ධ වගෙන යන දේ කුමක්ද ? මා දන්නා විධියට තිරියාය ප්‍රදේශයේ සිංහල ගොවීන්ට, දෙන ගොවි ණය පවා අත්හිටුවිමට බොහොම දක්ෂ ලෙස ඒ නිලධාරීන්ට බල කරන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම තිරියාය වාගේ ස්ථානයක ගොවීන්, සිංහල ජනතාව, අළුතෙන් ආර්ථික දියුණුවක් ඒ ප්‍රදේශයේ ඇතිකරගෙන ඒ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කරගෙන, දියුණු කරගෙන ඉදිරියට ඒම වැළැක්වීම සඳහා මේ අරගන්නා උත්සාහයන්ට අපි ඉඩ දුන්නොත් ඒ සිද්ධස්ථාන නැති වී යනවාට කිසිම සැකයක් නැහැ.

මේ ගරු සභාවේ සිටින අපි කවුරුත් දන්නවා, තිරියායේ ඇති ඓතිහාසික වැදගත්මක. ඒ ප්‍රදේශයේ ඒ ඓතිහාසික වැදගත්කම කියාපාන බෞද්ධ සංස්කෘතියේ තෂ්ටාවශේෂවල ඉතුරුවෙලා තිබෙන ටිකත් එතැනින් ඉවත්කර දැමීමට ලොකු ව්‍යාපාරයක් ගෙන යනවා. ඒ වාගේම මත්තාරම දිස්ත්‍රික්කයේ එවැනිම පැරණි බෞද්ධ සිද්ධස්ථානවලට එල්ලවී තිබෙන තර්ජනය විශාල එකක්. මේ යෝජනාවේ කියැවෙන පරිදි මේ සිද්ධස්ථානවල භික්ෂූන් වහන්සේලා නඩත්තු කරගෙන, සිද්ධස්ථාන රැක බලා ගැනීමට නම් අතිවාර්යයෙන්ම ඒ අවට වෙසෙන ජනයාගේ සහයෝගය, දැනය පිළිගැන්වීම, ජනයාගේ වෙනත් සහභාගිත්වයන් අවශ්‍යමයි. ඒ සිද්ධස්ථානවලට බැඳුණු ජනතාව ඒ ප්‍රදේශවලින් ඉවත් කළහොත් අතිවාර්යයෙන්ම සිද්ධස්ථාන තනවී භික්ෂූන් වහන්සේලාට ඒවායින් ඉවත් වී යාමට අවස්ථාව උදාවෙනවා. මෙන්න මේක තමයි අද සැලසුම් සහගතව ක්‍රියාත්මක විගෙන යන ව්‍යාපාරය. එයට මුහුණ දීම සඳහා අද මේ රට දෙකඩ කිරීමට, වෙන් කිරීමට ගෙන යන ව්‍යාපාරය පාලනය කිරීමට අවශ්‍ය පියවරවල් අපි අරගන්නට ඕනෑ. රාජ්‍ය පාලනය රට පුරා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. රාජ්‍ය පාලනය රට පුරා ක්‍රියාත්මක නොවෙනවා නම් සිංහල බෞද්ධ සිද්ධස්ථානවල නිජ භූමි ගණනාවක් මේ රටේ ජනතාවට අහිමි වන්නට පටන් ගන්නා කාල පරිච්ඡේදය වැඩි ඇත නොවෙයි. මේ තත්ත්වය තිවැරදි කරන්නට වහාම අවශ්‍ය පියවර ගැනීම රජයේ වගකීමක් වී තිබෙනවා. මහානායක ස්වාමීන් වහන්සේලා සහ වෙනත් නායක ස්වාමීන් වහන්සේලා මේ පිළිබඳව කර තිබෙන ප්‍රකාශන සහ ඉල්ලීම්වලට ඇහුම්කන් දීම ඊට වඩා වැඩි කිරීමට වෙනදාට වඩා අද අත්‍යවශ්‍ය වී තිබෙනවා.

පසුගිය කාලයේ මේ සභාවේ සිටි නැගෙනහිර පළාතේ මන්ත්‍රීවරයෙකු වන කාරියප්පර් මහතා පසුගිය දිනක මට ලිපියක් එවා තිබුණා. ඒ ප්‍රදේශයේ අද තර්ජන පවතින්නේ බෞද්ධ ජනතාවට, සිංහල ජනතාවට පමණක් නොවේය, මුස්ලිම් ජනතාවට පවා තර්ජන කරන්නට පටන්ගෙන තිබෙනවාය, ඔවුන්ට ඒ ප්‍රදේශවලින් පිට වෙන්නට කියා තිබෙනවාය කියා ඒ ලිපියේ සඳහන් කර තිබෙනවා. මේක ඉතාම භයානක තත්ත්වයක්. මේවා සම්බන්ධයෙන් අරගෙන තිබෙන පියවර මදිය කියන ටික තමයි, මේ සභාවේ සිටි මන්ත්‍රීවරයෙකු වන කාරියප්පර් මහතා සඳහන් කර තිබෙන්නෙ. එසේ නම් අපේ මුළු මහත් සාංස්කෘතික පදනමම වෙළාගෙන යටපත් කර ගැනීමේ මහා කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

මේ කාරණා නිසා තමයි, මහාචාර්ය තෙත්තකෝන් විමලානන්ද මහතා විසින් " ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය සහ සිංහලයාගේ අනාගතය " කියා 1970 පළ කළ පොතේ අදහස් ගැන මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරවත්තේ. මෙය දේශපාලන අර්බුදයක් නිසා පළ කළ පොතක් නොවෙයි. සමහර අය කියයි, අර්බුදයක් ඇති කාලයක පළ කර තිබෙන මේ අදහස් ජාතිවාදී අදහස්ය කියා. නමුත් සැහෙන විමර්ශන සහ ඓතිහාසික තොරතුරු මෙහි සඳහන් කර තිබෙනවා. සංවිධානාත්මකව බෞද්ධ සිද්ධස්ථාන නැති කරගෙන යන හැටි, බෝධීන් වහන්සේලා කපාගෙන යන හැටි ආදී වශයෙන් කරුණු රාශියක් මේ පොතේ සඳහන් වෙනවා. ඒවා ගැන අපේ කිසිම රජයක් ඕනෑකමින් මේ රටේ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමට අපොහොසත් වී තිබෙන තිසයි, අද මේ තත්ත්වය උද්ගත වී තිබෙන්නෙ.

වැව් වටා ගොඩ නැගුණු ඒ ආර්ථික සමාජ රටාව කඩා වැටීමට, ඒවා තනිවම බිඳ වැටීමට ඉඩ දුන්නා. ඊට අමතරව අපේ රටට අද ඇති වී තිබෙන තර්ජන නිසා මෙසේ සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම බෞද්ධ සිද්ධස්ථාන නඩත්තු කිරීමේ ප්‍රශ්නය මතු වෙනවා. මේ රටේ සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කරගෙන ඒවා දියුණු කිරීමට තම් එම ආරක්ෂාව සැලසීම සහ දියුණු කිරීම නිසි පාලනයක් යටතේ කිරීමට රජයට හැකි වෙන්න ඕනෑ. ඒ පිළිබඳව රජයට තිබෙන බලතල වෙනත් ආයතනවලට පවරන්නට ගියොත් ග්‍රාම සේවක කොට්ඨාශ විශාල ප්‍රමාණයක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ ගුණවර්ධන මහතා]

දැනට තිබෙන බෞද්ධ සිද්ධස්ථාන සහ නටබුන්වත් ආරක්ෂා කර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අද විවිධාකාරයෙන් ඇති කරන්නට බලාපොරොත්තු වන සංවිධාන තුළින් ඒ බලතල අරගත්තේ නැත්නම් සිද්ධ වන්න පුළුවන් විනාශය ගැන අපි කල්පනා කරන්න ඕනෑ.

මම මෙහිදී එක ලිපියක් කියවන්න බලාපොරොත්තු වුණා. ඒ මොකක්ද ? 1963 අගෝස්තු මාසය—ජාතිවාදී කලබලවලින් පසුව—ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයා විසින් මහ බ්‍රිතාන්‍යයේ " ටැමිල් ටයිම්ස් " තමැති සඟරාවේ පළ කළ ලිපියක්. විවිධාකාරයෙන් තොරතුරු සහ ගිවිසුම් පිළිබඳව එහි සඳහන් කර තිබෙනවා. විවිධාකාරයේ තොරතුරු එළිදරව් කිරීම එහි කර තිබෙනවා. ඔහු විසින් රජය සමඟ පැවැත්වූ රහසිගත සාකච්ඡා පිළිබඳව එහි කරුණු සඳහන් කර තිබෙනවා. මම ඒවා දිර්ඝ වශයෙන් කියවන්න යන්නේ නැහැ. මෙහි 4 වෙනි පිටුවේ අංක 1 සිට 10 දක්වා පළකර ඇති කරුණු 10 ත් ඔහු රජය සමඟ පැවැත්වූ රහසිගත සාකච්ඡා පිළිබඳව කරුණු එළිදරව් කර තිබෙනවා. රජය සමඟ පැවැත්වූ සාකච්ඡා මේ එක් කාරණයක් පිළිබඳව එහි මෙසේ සඳහන් වෙනවා :

"8. The Government has not removed the illegaliy erected Buddha Statue at Vavuniya junction though Your Excellency gave the order to remove it at the very first meeting of the inter-Party Committee in August 1981. If the Government is so absolutely powerless in removing an irritant to the Tamil people illegally erected by certain Sinhala public servants, can the Tamil people expect justice where Sinhala chauvinism dictates otherwise ?"

අද තිබෙන තත්ත්වය තුළ ඒ ප්‍රතිමාව එහි තිබෙනවාද—නැද්ද කියන එක අපි දන්නේ නැහැ. නමුත් මා උපුටා දැක්වූ ඒ ප්‍රකාශයේ පැහැදිලිවම සඳහන් වෙනවා, එය වවුනියා මංසන්ධියෙන් ඉවත් කිරීම සඳහා ජනාධිපතිතුමා නියෝග කළාය කියා. එසේ කරන හැටියට ජනාධිපතිතුමාගෙන් අතිවාර්යයෙන්ම ඉල්ලන්න ඇත්තේ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ වෙන්න ඕනෑ. මේ රටේ කිසිම බෞද්ධයෙක් ඉල්ලා තිබෙනවාද, කතෝලික පල්ලියක් ඉවත් කරන්නය : කඩා දමන්නය කියා ? මේ රටේ කිසිම බෞද්ධයෙක් ඉල්ලා තිබෙනවාද, මුස්ලිම් දේවස්ථානයක් කඩා දමන්නය කියා ? මේ රටේ කිසිම බෞද්ධයෙක් ඉල්ලා තිබෙනවාද, වෙනත් ආගමික ප්‍රතිමාවක් සිද්ධස්ථානයක් හෝ ඉන් කොටසක් ඉවත් කරන්නය කියා ? කිසිම බෞද්ධයෙක් ඉල්ලා තිබෙනවාද, බෞද්ධ පන්සල්වල තිබෙන හිත්දු කෝවිල් ඉවත් කරන්නය කියා ? එහෙම ඉවත් කර තිබෙනවාද ? නැහැ. වවුනියා දිස්ත්‍රික්කයේ, උප දිසාපති කොට්ඨාශයක තරමට සිංහල ජනතාව වෙසෙනවා, ඒ අයගේ සිතුම්-පැතුම් අනුව වවුනියාවේ මංසන්ධියේ තමන්ගේ ආගමික ප්‍රතිමාවක් ඉදි කිරීමේ ඇති වැරැද්ද මොකක්ද ?

බෞද්ධාගම මේ රටේ රාජ්‍යාගම ලෙස, ප්‍රධාන ආගම ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. එහෙම තිබෙද්දීත් බෞද්ධ ප්‍රතිමාවක් ඉවත් කරන්න රජය එකඟ වී තිබෙනවා නම් එය ඉතාමත් කනගාටුදායක දෙයක්. ඒ සඟරාවේ තිබුණු අතෙක් දේවල් ගැන මේ අවස්ථාවේදී කියන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අද අප සාකච්ඡා කරන මේ යෝජනාවටත් අදළ නිසයි, මා කලින් සඳහන් කළ ඒ වැදගත් කොටස ගැන අවධාරණයෙන් සඳහන් කළේ. මොකක්ද, ඒ සාකච්ඡා වටය ? මොකක්ද, එහිදී වුණු පොරොත්තුව ? එහෙම නම්, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයන්ගේ හැඟීම අනුව උතුරු පළාතේ බෞද්ධ සිද්ධස්ථානයන් වැඩිදියුණු කරන්න බැහැ ; බුද්ධ ප්‍රතිමාවක් ඉදි කරන්න බැහැ. බෞද්ධයන් තමන්ගේ ආගමික සිද්ධස්ථාන පවත්වාගෙන යෑම ගැන, ඒවා වැඩි දියුණු කිරීම ගැන ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ උදවිය විරුද්ධයි. රජය ඔවුන්ගේ ඉල්ලීමට එකඟ වුණාද කියන ප්‍රශ්නයයි, අප නගන්නේ. 'ටැමිල් ටයිම්ස්' සඟරාවේ සඳහන් අන්දමට තමා ඒ ප්‍රතිමාව එතැනින් ඉවත් කරන හැටියට ජනාධිපතිතුමා නියෝගයක් දී තිබෙනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**

**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க — உயர் கல்விப் பிரதி அமைச்சர்)**

(Mr. A. M. R. B. Attanayake–Deputy Minister of Higher Education)

නියෝජ්‍ය කථානායකතුමනි, මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) සඳහන් කළ අන්දමට 1983 අගෝස්තු මාසයේදී, ඒ ප්‍රකාශනය නිකුත් වී තිබෙන්නේ. ඒ වන විට 'ඒලාම්' මන්ත්‍රීවරු මෙහි නැහැ. ඒ නිසා එසේ පැළ වී තිබෙන්නේ, ඒ කණ්ඩායමේ බොරු ප්‍රකාශයක්. [බාධා කිරීම්] මහරගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මම ඒ ගැන පැහැදිලි කර දෙන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

මහරගම ගරු මන්ත්‍රීතුමා වගකීම භාර ගත්තවාද ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ඔව්, මම භාර ගත්තවා. 'ටැමිල් ටයිම්ස්' සඟරාවේ තිබෙන දේයි, මම කියෙව්වේ. එය සභාගත කරන්න මම ලෑස්තියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

'ටැමිල් ටයිම්ස්' සඟරාවේ තිබෙන දේ සත්‍යයක්යයි මන්ත්‍රීතුමා—[බාධා කිරීම්]

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

අමිර්තලිංගම් මහතා ඒ විධියේ ප්‍රකාශයක් කර තිබෙද්දී, එය බොරුවක් නම් ඒ බව ප්‍රකාශ කරන්න රජයට ඕනෑ තරම් කල් තිබුණා. [බාධා කිරීම්] නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා කියන දේවල් නම් පිළිගන්න බොහොම අමාරුයි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

සත්‍යය නිසා පිළිගන්න අමාරුයි ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ දකින්නේ බොහෝ විට සත්‍යය නොවෙයි. සත්‍යය දකිනවා නම් තමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ දේවල් පිළිබඳව එතුමා ඔහොම හැසිරෙන්නේ නැහැ. සත්‍යය කියන දේ මොකක්දයි සොයා ගැනීම අප කාටත්—

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

අමාරුයි.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

සත්‍ය නොවෙයි, අද කෙරෙන්නේ. මම ඔබතුමාට ගරු කරනවා, ගමකින් ඇවිත් [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

මම හිතන්නේ ඔය නියෝගය ගැන—මෙවැනි නියෝගයක් දුන්නාද නැද්ද කියන එක ගැන—සාකච්ඡා කිරීමට ඉඩ දීමට පුළුවන්කමක් නැහැ, වෙනම යෝජනාවක් නැතිව.

**ජී. ඩී. මහින්දසෝම මහතා (වවුනියාව දිසා ඇමතිතුමා)**
**(திரு. ஜீ. டீ. மகிந்தசோம — வவுனியா மாவட்ட அமைச்சர்)**
(Mr. G. D. Mahindasoma–District Minister, Vavuniya)

නියෝජ්‍ය කථානායකතුමනි—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
මම හිතන්නේ ස්ථාවර නියෝග 78 යටතේ—

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ඔබතුමා කියා සිටින්නේ නියෝගයේ පිටපතක් නැත්නම් සාකච්ඡා කිරීම යෝග්‍ය නැහැ කියාද ?

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
නියෝගයේ පිටපතක් පමණක් නොවෙයි, එයට වෙනම යෝජනාවක් තිබෙන්න ඕනෑ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
මා කථා කරන්නේ නියෝගය ගැන නොවෙයි. බෞද්ධ සිද්ධස්ථාන ගැන පමණයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
නියෝගය ගැන නොවෙයි නම් නමක් නැහැ. නියෝගය සත්‍ය නියෝගයක් කියා හිතන්න බැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
නියෝගය ගැන නොවෙයි මා කථා කරන්නේ. තමුන්නාන්සේ කියන කාරණය මා පිළිගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා කථා කරන්නේ මේ ප්‍රවෘත්තියේ තිබෙන දේ අද තිබෙන විවාදයට සම්බන්ධිත ප්‍රශ්නයක් හැටියටයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
ඒක වෙන්න පුළුවන්. ඒ නිසයි උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මතක් කළේ මේ නියෝගය ඇත්ත නියෝගයක් නොවෙයි කියා.

**ජී. ඩී. මහින්දසෝම මහතා**
**(திரு. ஜீ. டீ. மகிந்தசோம)**
(Mr. G. D. Mahindasoma)
ගරු මන්ත්‍රීතුමා අවස්ථාවක් ලබා දෙනවා නම් මම පැහැදිලි කිරීමක් කරන්න කැමතියි. වවුනියාව නගරයේ කොතුකාගාරයක් ඉදි කිරීමට යෝජිත ස්ථානයේ අතවසරයෙන් බුද්ධ ප්‍රතිමාවක් ගෙනවිත් තිබ්බා. මේ සිද්ධිය ගැන විශාල ආන්දෝලනයක් ඇති වූ අවස්ථාවේදී ආණ්ඩුව තීරණයක් ගත්තා ඒ බුද්ධ ප්‍රතිමාව අයින් කරන්නේ නැහැ කියා. කොතුකාගාරය විවෘත කළ පසුව ස්ථිරවම ඒ බුද්ධ ප්‍රතිමාව දැන් එහි නැත් පත් කර තිබෙන බව වවුනියා දිසා ඇමතිවරයා වශයෙන් මා ප්‍රකාශ කරන්න කැමතියි.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
තමුන්නාන්සේ දිසා ඇමතිවරයා හැටියට කරන ප්‍රකාශය අපි පිළිගන්නට සූදානම්. තමුන්නාන්සේලා මීට වඩා හොඳට ප්‍රකාශයක් කරනවා නම් වඩාත් හොඳයි. මෙය මුළු ලෝකය හමුවට ගිය සඟරාවක්. තමුන්නාන්සේලා මෙතෙක් කල් ඒ කියන්නේ 1985 මාර්තු අට වෙනිදා වනතෙක් ඉන්න ඕනෑ නැහැ, ලෝකයා ඉදිරියට ගිය දේ නැහැයි කියන්න. තමුන්නාන්සේලා යැවූ නානාපතිවරු බුදියගෙන හිටියද, මේවා පළවෙන විට ? [බාධා කිරීමක්] රජයේ නිලධාරීන් තීකම් හිටියද ? මොකක්ද මේවා ගැන ගත්ත ක්‍රියාමාර්ග ? මේ වගේ වැරදි ප්‍රවෘත්ති—

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට තමුන්නාන්සේ බුදියගෙන හිටියද ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
මම නිදගෙන හිටියේ නැහැ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
තමුන්නාන්සේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉන්නේ ප්‍රශ්න කරන්න විතරද ?

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
Order, please !

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
රජයේ වගකීම තිබෙන්නේ තමුන්නාන්සේලාට. ඇමතිවරු හැටියට එය ක්‍රියාත්මක කිරීමයි, තමුන්නාන්සේලාගේ යුතුකම. රජයයි රට පාලනය කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
මූලාසනයට කථා කරන්න.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ආණ්ඩුව බුදියගෙන ඉඳල ඒ ගැන විපක්ෂයෙන් අහල වැඩක් නැහැ. තමුන්නාන්සේලා මේවා ගැන විපක්ෂයෙන් අහනවා නම් විපක්ෂයට ආණ්ඩුව භාර දෙන්න. තමුන්නාන්සේලාට ආණ්ඩුව කර ගැනීමට බැරි නම් තමුන්නාන්සේලාගේ යටතේ ඉන්න නිලධාරීන්ට නියෝග නිකුත් කළේ නැත්තේ මොකද ? මේ නානාපති සේවය තීකම් හිටියේ මොකද, ඒවා පළවෙනිවිට ? මේ රටේ සිංහල බෞද්ධ අයයි, දුවිඩයින් මරා දමන්නේ කියන වැරදි ප්‍රවෘත්තිය අද ලෝකය පුරා ප්‍රචාරය කරගෙන යනවා. මේ වාගේ ප්‍රකාශයන් ඒවාට උදව් වී තිබෙනවා. මුළු ලෝකයටම වැරදි ප්‍රවෘත්ති පලවෙලා තිබෙන්නේ, මේ වාගේ දේවල් ගැන රජයේ ඉහළ අය ඇස්වහගෙන තිකම් සිටින නිසයි ; මේවා පල කරන්නට ඉඩ දී ඒවා දකදකත් අතින් පැත්ත බලන නිසයි. අද තමුන්නාන්සේ ඇවිත් විපක්ෂයේ වැරදි ගැන කථා කරන්න පුළුවන්. විපක්ෂය ආණ්ඩු කරන සමයේදී බණ්ඩාරනායක මැතිණිය මේ රටේ ආණ්ඩු කරනවිට ඔය වගේම සත්‍යග්‍රහ ව්‍යාපාර ඇති වුණා. නමුත් සුමානෙත් දෙකින් [බාධා කිරීමක්] විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කියා බැලුවේ නැහැ, ඒ අය නිවාස අඩස්සියේ තබා, යාපනය පාලනය කළා. යාපනය පාලනයට යටත් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු නිවාස අඩස්සියේ තියන්න ඕනෑ නම් එය පවා කළා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව එහෙම එකක්වත් කළාද ? මන්ත්‍රීකම නැතිවීමෙන් පසු නිදහස් කර තිබෙනවා, අත් අඩංගුවට ගත් අය. ඒ නිසයි මා කියන්නේ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාට සත්‍ය පිළිබඳව සොයා ගැනීමට හුඟක් කාලයක් ගතවෙයි කියල. සත්‍ය සොයා ගත් දවසට තමුන්නාන්සේට හුඟක් දුරට හේරෙයි සත්‍ය කියන්නේ මොකක්ද කියල. විශ්ව විද්‍යාලයේ—

**රවඩ පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரண — அக்மீமன)**
**(Mr. Richard Pathirana–Akmeemana)**
හාමුදුරුවන්ට ගහලා—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Order, please ! ඒ ගැන තොවෙයි දැන් කතා කරන්න තිබෙන්නේ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලි කරමින් ආවේ පැරණි බෞද්ධ සිද්ධස්ථානවලට අද සිදුවන තර්ජන ගැනයි. පැරණි බෞද්ධ සිද්ධස්ථානවලට අද සිදුවන මේ ආකාරයේ තර්ජනයන් නිසා මෙවැනි පැහැදිළි වැඩපිළිවෙලක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙලා තිබෙනවා. මේ රටේ සංස්කෘතිය මෙන්ම මේ රටේ ජාතික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම සඳහාත් මේ රටේ ජනතාවගේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහාත්, අවශ්‍ය මෙම ක්‍රියාමාර්ග ඇති කිරීම සඳහා අද කැප වීමක් අවශ්‍ය වෙලා තිබෙනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ පිළිබඳව ඕනෑවටත් වඩා තොරතුරු දැන ගන්නට තිබෙනවා. මම තැවත කියා සිටින්නේ මෙන්න මේ කාරණයයි. මේ රටේ ජනතාවගේ ඉඩම් අයිතිය පිළිබඳව තිබෙන යම් යම් රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී, මේ රටේ සිංහල ජනතාවට අහිමිවුණු ඉඩම් නැවත ලබා ගැනීම සඳහා රජයෙන් ඉටු විය යුතු යුතුකම් අද සම්පූර්ණයෙන් ඉෂ්ට වෙලා නැහැ. එය ඉෂ්ට කිරීම රජයේ අනිවාර්ය යුතුකමක්. එය බෞද්ධ සිද්ධස්ථාන සහ බෞද්ධාගම රැක ගැනීමට තිබෙන එක මාර්ගයක් හැටියට පෙන්වා දෙන්නට කැමතියි.

අද උඩරට වතුකරයේ තත්ත්වය පිළිබඳව කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආතන්ද දසනායක මහතා) පසුගිය අඟහරුවාදා මෙම පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා. කොත්මලේ සිංහල ජනතාවට—[බාධා කිරීමක්]—කොත්මලේ යටවෙච්ච එකයි තිබෙන පාඩුව. කොත්මලේ වෙසෙන ජනතාවට ඒ අවට ප්‍රදේශවලින්—තේවතුවලින්—භූමි ලබා ගැනීම සඳහා තිබුණු ප්‍රශ්න ගැන කොත්මලේ ගරු මන්ත්‍රීතුමා එද ප්‍රකාශ කළා. තමුත් ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා මැදිහත් වූ විට එතුමාගේ වෘත්තීය සමිතියේ අයට ඒ ප්‍රදේශයේ හොඳ තේ වතු භූමියෙන් කොටස් ලබා ගැනීමට ඇති වූ හැකියාව පිළිබඳව එතුමා කරුණු ප්‍රකාශ කළා. උඩරට ජනතාවගේ අයිතිවාසිකම් ඒ ජනතාවට නැවත ලබා ගැනීම සඳහා තිබෙන අරගලයේදී අවාසිදායක තත්ත්වයකට අද සිංහල ජනතාව වැටී තිබෙන බව එයින් පෙනී යනවා.

මේ රටේ සාරය තිබෙන්නේ උඩ රට ප්‍රදේශයේයි. මේ රටේ සෑම ගංගාවක්ම පටන් ගන්නේ උඩරට කඳුකරයෙන්. මේ රටේ මහා පරිමාණ විදුලි බල යෝජනා ක්‍රම සියල්ලක්ම අද ඇති වී තිබෙන්නේ උඩරට ප්‍රදේශයේයි. ලක්ෂපාන යෝජනා ක්‍රමය දෙස බැලුවත් වික්ටෝරියා යෝජනා ක්‍රමය දෙස බැලුවත්, කොත්මලේ යෝජනා ක්‍රමය දෙස බැලුවත්, ඒ සියල්ලක්ම පාලනය වන්නේ මේ ප්‍රදේශය තුළ බව පෙනී යනවා. ජල විදුලි බලය පාලනය කර ගැනීමට මේ රටේ ජනතාවට ඇති හිඳහසට තර්ජනයක් වන්නට පුළුවන් වැඩපිළිවෙළක් තිබෙනවාදැයි සොයා බැලීම අපේ යුතුකමක් වෙලා තිබෙනවා. එවැනි වැඩපිළිවෙළක් යෙදුණොත් සිදු වන්නට පුළුවන් විනාශයන් පිළිබඳ අනාවැකි අපි ඔතැනදීම පැහැදිලි කර තිබෙනවා. ඒ පිළිබඳව තොරතුරු ඇතිව පර්යේෂණ කළ ආචාර්යවරු, මහාචාර්යවරු, අදහස් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අදහස් පිළිගත්තේ නැති අය සිටීම නිසා තමයි මේ රට අද බෙදජනක තත්ත්වයකට වැටිලා තිබෙන්නේ. උගතුන්ට බුද්ධිමතුන්ට විහිළුකාරයන් ලෙස සලකන්නට, ඒ අයගේ බුද්ධියට උගත්කමට ගරු කරන්නට ඉගෙන ගත්තේ නැති පිරිස් නිසා තමයි අද මේ තත්ත්වය උදාවෙලා තිබෙන්නේ. මේ පිළිබඳව පර්යේෂණ පැවැත්වුණා. තෙත්තකෝත්ත විමලානන්ද මැතිතුමා කලක් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක්ව සිටි කෙනෙක්. මෙවැනි උතුමන්ලාට මෙවැනි පර්යේෂණ කරන්නට හිඳහස තිබුණු නිසා, එවැනි මහාචාර්යවරුන්ට පර්යේෂණවලට ඉඩකඩ තිබුණු නිසා විශ්වවිද්‍යාල තුළ සිය අදහස් ඉදිරිපත් කරන්නට අයිතිය තිබුණු නිසා, මෙවැනි තොරතුරු හෝ ඉදිරිපත් කරන්නට හැකි වුණා. එවැනි පර්යේෂණවලට එවැනි දේවලට ඉඩකඩ නොදුන්නෝතින් සිදුවන්නේ කුමක්දැයි කියන ප්‍රශ්නය ගැන අපි කල්පනා කරන්නට ඕනෑ. මත්ද, වෙනත් රජයේ දෙපාර්තමේන්තු මඟින් පමණක් කෙරෙන කටයුතු තම් පාලනය කර ගන්නට පුළුවන්.

මාදුරුඔය දිඹුලාගල ඇති වුණු සිද්ධිය ගැන අපි දන්නවා. දහස් ගණන් සිංහල ගම්වැසියන් දිඹුලාගල නායක ස්වාමීන් වහන්සේගේ නායකත්වයෙන් එද ඒ අළුතෙන් වතුර ගලන ගොවි බිම් කරා ගියා. පොළොන්නරුව හිතුරක්ගොඩ අවට ඒ ජනපදවල තුන්වන පරම්පරාවට අද තමන්ගේ පවුල් නඩත්තු කර ගැනීමට බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ තරුණයන් ගිහින් ඉඩම්වල පදිංචි වී ගොවිතැන් කරන විට රජයේ දෙපාර්තමේන්තුවල මාර්ගයෙන් ඔවුන් ඒ තැන්වලින් ඉවත් කිරීමට නියෝග ලැබුණා. මේ පිළිබඳව තැවත තැවතත් කියන්නට ඕනෑ නැහැ. ඕනෑ තරම් තොරතුරු පළ වී තිබෙනවා. ඕනෑ තරම් තොරතුරු ලේඛනගත වී තිබෙනවා. දිඹුලාගල ස්වාමීන්වහන්සේ රටට ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා තමයි, මේ පැරණි බෞද්ධ සිද්ධස්ථාන වටා තිබෙන ගුමිත් දියුණු කර ගැනීමට පැහැදිලි වැඩ පිළිවෙළක් අවශ්‍ය වන්නේ.

ඒ විතරක් නොවෙයි, ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට ඒ සඳහා අවශ්‍ය සහයෝගය ඇති කර ගැනීමේ වැදගත්කමක් තිබෙනවා. මොකද ? මීට පෙරාතුව මහාභාරකාරවරයාගේ යටතේ බොහෝ වැඩ කටයුතු තිබුණා. තමුත් මහාභාරකාරවරයාගේ යටතේ තිබුණු කටයුතු බොහොමයක් පසුගිය කාලයේ බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයාගේ යටතට පත් වුණා. බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයාගේ යටතට පත් වුණු කාර්යයන් මීට වඩා වෙඟවත් වැඩ පිළිවෙළක් මඟින් ඉදිරියට ගෙනයාමට ආර්ථික සම්පත් ඇති කර ගැනීමේ හැකියාව තිබෙන්නට ඕනෑ. ඒ තුළින් පමණයි, භික්ෂූන් වහන්සේලාට තමන්ගේ සිද්ධස්ථාන දියුණු කර ගැනීමේ හැකියාවක් ඇති වෙන්නේ.

ඒ වාගේම භික්ෂූන් වහන්සේලාට අද අධ්‍යාපන කටයුතු කර ගෙන යාමේ වැදගත්කම තිබෙනවා. ලෝකය වෙනස් වී තිබෙනවා. ලෝකයේ අලුත් තොරතුරු සමඟ තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක තිබෙනවා. ඒ නිසා භික්ෂූන් වහන්සේලාට තමන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළට ගෙන යාමේ අවශ්‍යතාවයක් තිබෙනවා. විවිධ ක්ෂේත්‍ර පිළිබඳව ඇති කරගත යුතු දැනුම ලබා ගැනීම සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සල්ලි ගෙවා පෞද්ගලික විශ්ව විද්‍යාලවලට යන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ආගමික නායකයන්ගෙන් විවිධ ප්‍රශ්න මතු වෙන අවස්ථාවලදී ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයකින් ඒ තොරතුරු පිළිබඳව මුහුණ දෙන්නට තම් එවැනි අධ්‍යාපන අවස්ථාවල් පවා සැපයීමට ඉඩ ප්‍රස්ථාව ඇති කර දීමට මීට වැඩිය උසස් වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑය කියන එකයි අප කියා සිටින්නේ. එවැනි වැඩ පිළිවෙළක් තිබුණොත් තමයි, මේ රටේ ඇති සිද්ධස්ථාන ආරක්ෂා කරගෙන දියුණු කර ගන්නට පුළුවන් අඛණ්ඩව වැඩ පිළිවෙළක් ඉදිරියට ඇති වෙන්නේ. එසේ නැති වුණොත් ඉදිරි කාලයේදී මේ රටේ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය සීමා වෙන තත්ත්වයේ පරිවර්තනයක් ඇතිවීමකට තුඩු දෙන්න පුළුවන්.

ඇයි ? අද රටේ ආර්ථිකයේ ජීවත් වීමේ ප්‍රශ්නය මතු වෙමින් පවතිනවා. වෙනද දනය දුන් ප්‍රමාණයට අද දනය දෙන්නට බැරි තත්ත්වයකට පරිවර්තනය වෙමින් පවතිනවා. පන්සලක් දියුණු කර ගැනීම, තඩත්තු කර ගැනීම මහා ව්‍යාපාරිකයන් කීප දෙනෙකුගේ උදව්වෙන් පමණයි කර ගන්නට පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා එහි රදා පැවැත්මේ දැඩි කැපවීම, ආගමික කැපවීම ආරක්ෂා කර ගන්නට නම් රජය හෝ මැදිහත් වී ඒ සිද්ධස්ථානවල ජීවත් වන, වාසය කරන භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාවට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ඉදිරිපත් වෙන්නට ඕනෑ.

උතුරු හා නැගෙනහිර පළාත්වල තිබෙන සමහර සිද්ධස්ථානවලට හරියාකාර ආවාසයක් නැහැ. හරියාකාර ආවාසයක් නැති ස්ථාන රාශියක් තිබෙනවා. එවැනි ස්ථානවල පැහැදිලි වැඩ පිළිවෙළක් අරඹන්නට පුළුවනි. මේ රටේ ගෙවල් දහස් ගණනින් ඉදි වෙන යුගයකදී හරියාකාර ආවාස නැති පන්සල් සියයක් හෝ දෙසියයක් තෝරාගෙන ඒවා ස්ථාපිත කිරීම සඳහා ක්ෂණික වැඩ පිළිවෙළක් දියත් කරන්නට බැරි ඇයි ? එවැනි වැඩ පිළිවෙළක් දියත් කළොත් ඒ වටා ඒ ගම්මාන ස්ථාපිත වෙමින් එම ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ ප්‍රශ්නය පිළිබඳව මම මීට වඩා දීර්ඝ ලෙස සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ කාරණය පිළිබඳව අප ඉදිරිපත් කර තිබෙන අදහස් පැහැදිලි වෙනවා ඇතැයි කියා අපි හිතනවා. අපේ මිහිත්තලේ මන්ත්‍රීතුමා (දයාරත්න වලගම්බාහු මහතා) ඉදිරිපත් කර ඇති මේ යෝජනාවේ වැදගත්කම අන් කිසි දවසකටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වඩා අද මේ රටේ ජනතාවගේ ඉදිරි ගමන පිණිස මතු වී පෙනෙන අවස්ථාවක් මේ. අපේ රටින් කොටසක් වෙන්වී යාමට දරන උත්සාහයේදී, විශේෂයෙන්ම සිංහල බෞද්ධ ජනතාවට අසාධාරණ ලෙස ලෝ පුරා එල්ල කරන චෝදනාවලටත් ඒ වාගේම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බෞද්ධාගමටත් මුල් තැන දෙනවාය කියන වගන්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මතු වී ඇති ප්‍රශ්නයත් ගැනත් සිත්යොමු කර මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේ අධිෂ්ඨාන සහගත වැඩ පිළිවෙලක් අපි ඇති කළහොත් එය අනිවාර්යයෙන්ම මේ රටේ ජාතීය භාවයට සහ ජාතික ස්වාධීනත්වයට ආරක්ෂාවක් වෙනවා. මේ රටේ ජාතික ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට නම් අප රටට එල්ල කර ඇති ලෝක ද්‍රවිඩ ව්‍යාපාරයේ තර්ජනය ගැන සැලකිලිමත් වෙන්නට ඕනෑ. මේ අන්දමට වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටියත් ඇත්ත වශයෙන්ම උතුරේ ජීවත්වන ජනතාවට මෙරටින් වෙන්වී යාමේ ඉල්ලීමක් තිබෙනවාද කියන ප්‍රශ්නය මතු වී තිබෙනවා. ඇත්තෙන්ම සුළු පිරිසක් මුළු ද්‍රවිඩ ජනතාවම මෙයට යොමු කර ගැනීමේ උත්සාහයක යෙදී සිටිනවා.

ගරු තියෝජ්‍ය කථානායකතුමනි, ද්‍රවිඩ මුන්නේත්‍ර කඩගම් ව්‍යාපාරය තුළින් වෙනම ද්‍රවිඩ රාජ්‍යයක් ඉල්ලා සිටීමේ වැඩ පිළිවෙළක් ඉන්දියාවේ දියත් කළාට පස්සේ 1961 දී, ඉන්දියානු ලෝක් සභාව විසින් තැසිගිය පණ්ඩිත ජවහර්ලාල් නේරු මැතිතුමාගේ නායකත්වයෙන්, එම කටයුතු නීති විරෝධී කරමින් 16 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නීති පොතට එකතු කළා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මදුරාසි ප්‍රාන්තයේ වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටීමේ ක්‍රියාදාමය නැවතුණා. ඒ ලෝක ද්‍රවිඩ ව්‍යාපාරයේ තර්ජනය අද වෙනත් ප්‍රදේශයකට යොමු වී තිබෙනවාය කියන කාරණය මතක් කරන්නට ඕනෑ. ශ්‍රී ලංකාව තෝරා ගෙන තිබෙන්නේ අන්න ඒ ලෝක ද්‍රවිඩ ව්‍යාපාරයේ කඳවුරක් ලෙසටයි. එය මේ රටේ පමණක් නොවෙයි, ස්වාධීන ජාතීන්ගේ නිදහසට තර්ජනයක් වන යුද බලවතුන්ගේ උදව් ඇතුව, ඒ අයගේ සහයෝගය ඇතුව, මූල්‍යමය ආධාර ඇතුව, විශේෂයෙන්ම බටහිර ලෝකයේ ඒ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමේ වැඩපිළිවෙළක් තිබුණු නිසයි මෙවැනි තත්ත්වයකට මෙය ගොඩනැගුණේ.

ත්‍රිකුණාමල වරාය ප්‍රධාන කර ගත් වෙනම රාජ්‍යයක් බිහි කිරීම කරා ගමන් කරන්න පුළුවන් වුණොත්. අනිවාර්යයෙන්ම මේ රටේ නිදහසට වන තර්ජනය පමණක් නොවෙයි. ඉන්දියාවෙන් කැඩී යාමේ ආරම්භයක් ලෝක ද්‍රවිඩ ව්‍යාපාරයේ දීර්ඝ කාලීන උත්සාහයත් එයයි කියන ටික අප තේරුම් ගන්නට ඕනෑ. එම නිසා ඉන්දියානු ජනතාවත්, මේ රටේ ජනතාවත් අතර මිත්‍රත්වය තහවුරු කර ගැනීමට මෙන්ම, ඉන්දියාවේ එක්සත් කමට ඇති ලොකුම තර්ජනය වෙත්තේත් මේ ඊලාම් ව්‍යාපාරයට දෙන අණ සහ ශක්තිය කියන ටික අප මොහොතකටවත් අමතක කරන්නට ඕනෑ නැහැ. ඉන් පසුව මුළු දකුණු ආසියාකරයම ඉන්දියාවෙන් කැඩී යාමකට තුඩු දුන්නොත් එයින් ඇති වන විනාශකාරී යුද තත්ත්වය තුළ අපේ රටට සිදු වන්නේ කුමක්ද යන භයානක ප්‍රශ්නය මතු වෙයි. එම නිසා මේ ඊලාම් ව්‍යාපාරය අපේ රටේ ජාතීය භාවයට විරුද්ධව ගෙන යන ව්‍යාපාරයක් පමණක් නොවෙයි මේ ලෝක ව්‍යප්ත ද්‍රවිඩ ව්‍යාපාරය, විශේෂයෙන්ම බටහිර ලෝකයේ යුද බලවතුන්ගේ ඕනෑකම අනුව, බටහිර ලෝකයේ විවිධ බලවතුන් විසින් දකුණු ආසියාකරයේ අස්ථිර යුද තත්ත්වයන් ඇති කිරීම සඳහා උපයෝගී කර ගන්නා ව්‍යාපාරයක් හැටියට මතක් කළ යුතුයි. අන්න ඒ නිසා මිහින්තලේ මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම තුළින්, බෞද්ධ සිද්ධස්ථානවල හික්ෂූන් වහන්සේලා ස්ථාපිත කිරීමෙන්, අර ව්‍යාපාරයට එරෙහිව ඉෂ්ට කරන්නට පුළුවන් සේවාවට තවත් ශක්තියක් එකතු වෙනවා. එම නිසා මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කමට ඒ කොටසද එකතු කරමින් මා නවතිනවා.

ප්‍ර. හා. 10.29

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**

**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க — உயர் கல்விப் பிரதி அமைச்சர்)**

(Mr. A. M. R. B. Attanayake—Deputy Minister of Higher Education)

ගරු තියෝජ්‍ය කථානායකතුමනි, යන එන මං නැතුව අපේ ගරු මන්ත්‍රීවරයකු ගිය පාරක් දිහා මම බලාගෙන හිටියා. යෝජනා කර තිබෙන්නේ, ලංකාවේ පත්සල් පිළිබඳව වගකීම් සහිත මට්ටමකින් රජය ක්‍රියා කළ යුතුය, ඒ අදහස පිළිගෙන ක්‍රියා කළ යුතුය කියායි. මේ ගැන කථා කරන්නට ගිහින් ජවහර්ලාල් නේරුතුමා අල්ලා ගෙන, දෙමළ සංවිධානය අල්ලා ගෙන මහ විශාල පටලැවිල්ලකට මැදිවී සිටියා. [බාධාකිරීමක්] ඉන්න, මන්ත්‍රීමාට මම කියලා දෙන්නම්, තමුන්නාන්සේ කර ගත් වරද මොකක්ද කියල.

ගරු තියෝජ්‍ය කථානායකතුමනි, බෞද්ධාගමේ වැදගත් ස්ථානයක් ගිහි විනයට ලැබී තිබෙනවා. සඟ විනය සහ ගිහි විනය කියා දෙකක් බුදුහාමුදුරුවෝ දේශනා කර තිබෙනවා.

**රිචඩ් පතිරණ මහතා**

**(திரு. றிச்சட் பத்திரண)**

(Mr. Richard Pathirana)

තමුන්නාන්සේට ඒ දෙකම තැහැ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**

**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**

(Mr. A. M. R. B. Attanayake)

ගිහි විනයේ සඳහන් වෙනවා, කිසියම් කෙනෙක් සංඝයා හේද කළොත්, දෙමව්පියන් හරි ඝාතනය කළොත්, බුදු රජාණන් වහන්සේගේ ඇඟේ ලේ සෙලෙව්වොත්, මෙන්න මේ ආකාරයට පංචානන්තර්ය පාප කර්මවල යොදුණොත් ඒ අයට කවදාවත් සුගතියක් නම් දකින්නට ලැබෙන්නේ නැතැයි කියා. අද පත්සල් දියුණු කරන්නට කථා කරන ඇත්තෝ මුළු රටේම සංඝ හේදය කර අවසානයි. වැඩිහිටි ගරුතර මහා සංඝරත්නය ධර්මධරව විනයධරව හැසිරෙන අතර කුඩා හාමුදුරුවරු ටික අල්ලාගෙන " හාමුදුරුවනේ පයින් ගිහින් බැහැ ඤාති ප්‍රාතිහාර්ය පාන්නට, තගින්න වහලට " කියල මෙතුමා හැන්දෑවට ගිහින් උගන්වනවා. කුඩා හාමුදුරුවරුන්ට රහත් වන්නට උගන්වන්නේ, ඤාති ප්‍රාතිහාර්ය පාන්නට කියන්නේ, වහළ උඩට නැඟලයි. එහෙම කියන එක්කෙනා මෙතැනට ඇවිත් පත්සල් දියුණු කරන්නට කථා කරනවා.

**දිනේෂ ගුණවර්ධන මහතා**

**(திரு. தினேஷ் குணவர்த்தன)**

(Mr. Dinesh Gunawardene)

ස්වාමීන් වහන්සේලා විශ්ව විද්‍යාලවලට එපාය කියමින් ඒ කාලයේ තමුන්නාන්සේ දැන්වීමක් උස්සාගෙන සිටියා. කාලයක් බොරලැස්ගමුවේ හිටියානේ. අන්න ඒ කාලයේ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**

**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**

(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේගේ තාත්තා, සූරිය මල් ව්‍යාපාරයේ සිටම ආගම වහකදුරුයි කී පුද්ගලයා, මැරුණේ එක්සත් ජාතික පක්ෂයේ බුද්ධාගම පිළි අරගෙනයි. [බාධාකිරීමක්]

**දිනේෂ ගුණවර්ධන මහතා**

**(திரு. தினேஷ் குணவர்த்தன)**

(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ කියන්නේ සම්පූර්ණ බොරුවක්. එවැනි කිසිම ප්‍රකාශයක් කර නැහැ. මම තමුන්නාන්සේට අභියෝග කරනවා. උසස් අධ්‍යාපන තියෝජ්‍ය ඇමති හැටියට පටටපල් බොරු කියන්න එපා. [බාධාකිරීමක්] එය ඉල්ලා අස් කර ගන්න. එය සම්පූර්ණ බොරුවක්. [බාධාකිරීමක්]

**තියෝජ්‍ය කථානායකතුමා**

**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**

(Mr. Deputy Speaker)

Order, please ! කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ විවාදයට අවශ්‍ය නැති දේවල් කියන්න ඕනෑ නැහැ.

**දිනේෂ ගුණවර්ධන මහතා**

**(திரு. தினேஷ் குணவர்த்தன)**

(Mr. Dinesh Gunawardene)

එය සම්පූර්ණයෙන්ම ඉල්ලා අස් කර ගන්න. ඒ කිව්වේ අසත්‍යයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
පියා කළ දේ දන්නේ යහජාත පුතා පමණයි. අවජාතක අය දන්නේ නැහැ. [බාධාකිරීමක්]

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ගරු තියෝජ්‍ය කථානායකතුමනි, ඒ කතාව සම්පූර්ණයෙන්ම ඉල්ලා අස් කර ගන්නය කියා මම කියනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මම එය ඉල්ලා අස් කර ගන්නේ නැහැ. [බාධාකිරීමක්]

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
පට්ටපල් බොරුකාරයා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
තමුන්නාන්සේගේ නාත්තා සූරියමල් ව්‍යාපාරයේ නිර්මාතෘවරයා. [බාධාකිරීමක්]

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
Order, please !

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ඔෂ්ට විධියට කථා කරන්න. කිසි ඔෂ්ටකමක් නැහැ.

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
මම ඔතන විධියට කියීම වුවමනාවක් නැති කරුණක්—[බාධා කිරීමක්]

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ඒ කී දෙවල් ඉල්ලා අස් කර ගන්නය කියා මම ඉල්ලා සිටිනවා. පුද්ගලික චරිත ඝාතනය අවශ්‍ය නැහැ.

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
ඒක වැරදියි.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
මේ විධියේ පහත් තත්ත්වයේ කතා මේ ගරු සභාවේ කීම වැරදියි. [බාධා කිරීමක්]

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
මේ මන්ත්‍රීතුමාගේ පියා ගැන ඒ විධියට වචනයක්වත් කීම වැරදියි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
ඒ පියා ගැන මම අගැයීමක් කරන්නයි ආවේ. මේ අය ඒක කෑවා. ඒ පියා උත්තම පුද්ගලයෙක්. [බාධා කිරීමක්]

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ගරු තියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කළ ප්‍රකාශය ඉල්ලා අස් කර ගත්තය කියන්න. ඒ සම්පූර්ණ බොරු ප්‍රකාශය ඉල්ලා අස් කර ගත්තය කියන්න. එමෙන්ම එතුමා පාවිච්චි කළ ඒ වැරදි වචනය පාර්ලිමේන්තුවට ඔබින්නේ නැති වචනයක්. එය ඉල්ලා අස් කර ගන්නය කියා නියෝග කරන්න. [බාධා කිරීමක්]

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මම ඒවා ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මම ඒ පියාට ගරු කරනවා. [බාධා කිරීමක්]

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
Order, please! කරුණාකර කියන්න, ඉල්ලා අස් කර ගන්නට ඕනෑ වචනය මොකක්ද කියා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
මේ උසස් අධ්‍යාපන තියෝජ්‍ය ඇමතිතුමා මේ දැන් ප්‍රකාශ කළා "අවජාතක" කියා වචනයක්. එතුමා එය මොන අදහසකින් කිව්වාදැයි මම දන්නේ නැහැ. කරුණාකර එය ඉල්ලා අස්කර ගන්නය කියන්න.

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
ඒ වචනය පාවිච්චි කළා නම් එය වැරදි දෙයක්.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
මොකක්ද මේ අර්ථයක් නැති විධියට කරන කථාව ? කථාවක් කරනවා නම් කථා කරන්න පුළුවන්. උසස් අධ්‍යාපන තියෝජ්‍ය ඇමති හැටියට ඒ ගෞරවයවත් තබන්නන ඕනෑ නේද ? [බාධා කිරීමක්]

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
ඒ වචනය පාවිච්චි කළා නම් කරුණාකර එය ඉල්ලා අස් කර ගන්න.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
ගරු තියෝජ්‍ය කථානායකතුමනි, එය ඉල්ලා අස් කර ගන්නට පුළුවන්. මම එය විග්‍රහ කරන තුරු මෙතුමා ඉන්නේ නැහැනේ. [බාධා කිරීමක්]

**තියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
එහෙම වචනයක් පාවිච්චි කළේ නැත්නම් "පාවිච්චි කළේ නැහැ" කියන්න.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
ගරු තියෝජ්‍ය කථානායකතුමනි, බණපොතේ තිබෙනවා "ජාතක" "අවජාතක" ආදී වචන. ඒවා පාර්ලිමේන්තුවට අගෞරව වන වචන නොවෙයි. එහෙමතම් බණපොත් ඔක්කොම පුළුස්සන්නට වෙනවා. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)
මමත් කියනවා තමුත්තාත්සේත් අවජාතකයි කියා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මම "Unparliamentary" වචනයක් පාවිච්චි කළේ නැහැ. මම පාවිච්චි කළේ "Parliamentary" වචනයක්. ඉතින් ඇයි මම එය ඉල්ලා අස්කර ගත්තේ ? මම පිලිප් ගුණවර්ධන උත්තාත්සේට ගරු කරනවා. ඒක එපා කියලද කියත්තේ ? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
ඒ "අවජාතක" කියන වචනය ඉල්ලා අස් කර ගත්තය කියන්න කියා මම නියෝග කරනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
තමුත්තාත්සේ කියන නිසා මම එය ඉල්ලා අස් කර ගත්තවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
මම කියන නිසා නොවෙයි, තමුත්තාත්සේ එය පිළිගත්ත ඔනෑ. [බාධා කිරීමක්] එය ඉල්ලා අස් කර ගත්තා. කරුණාකර තවත් එවැනි වචන පාවිච්චි කරන්න එපා. අපි මේ සාකච්ඡාව කරන්නේ බෞද්ධ සිද්ධස්ථාන ගැනයි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මම ඒ වචනය ඉල්ලා අස් කර ගත්තවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
අපි කථා කරන්නෙ බෞද්ධ සිද්ධස්ථාන ගැන. ඒ නිසා මේ සාකච්ඡාවට ඔය විධියේ වචන වුවමනා නැහැ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය වචනය හැදුණු හැටි මුල සිට අගට විස්තර කරන්න මට පුළුවනි. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. මම තමුත්තාත්සේගේ නියෝගයට යටත් වෙනවා. තමුත් ඒක තරක වචනයක් නොවෙයි. ඒක නරක වචනයක් නොවෙයි කියා මම කියන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)
ඒ වචනය හොඳයි කියා ගරු මන්ත්‍රීතුමා හිතුවත් මම කල්පනා කරන්නේ ඒක හොඳ මදියි කියලයි.

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
(Mr. Ananda Dassanayake-Kotmale)
ආ, ඒක හොඳටම ඇති.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උදවිය ගරු ස්වාමීන්ද්‍රයන් වහන්සේලා හේද — ඔන්න කරලා වහලවල් උඩ නැඟී ප්‍රාතිහාර්ය පාන්නයි ස්වාමීන් වහන්සේලාට කියලා අපි වගකීම බාරගත්තම් කියමින් දේශන පවත්වලා කටයුතු කරන ගමන් පාර්ලිමේන්තුවට ඇවිත් අපට කියනවා පන්සල් ටික ආරක්ෂා කර ගත්තලු. ඒලම් කොටි සංවිධානය මඟින් දෙන සාම්ප්‍රදායික නොවන ප්‍රවෘත්ති මාධ්‍යයක් ඔස්සේ පසුගිය සතියට ඉස්සෙල්ලා සතියේ ඒ අයගේ ප්‍රවෘත්ති ප්‍රකාශකයකින් කියූ දේ මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) දන්නවාද ? " කොටි සංවිධානය ලංකාවේ බලය අල්ලනවා, අල්ලා ගත් වහාම එක කථ සිවුරක් මේ රටේ තියන්නේ නැහැ " යි ඔවුන් ප්‍රචාරය කළ බව මන්ත්‍රීතුමා දන්නවාද ? ඒක පිළිගත්නවාද ? [බාධා කිරීමක්] තමුත්තාත්සේගේ කන් තිබෙන්නේ දෙපොළක.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කතා කරන්නේ මගෙන් ප්‍රශ්න අහන්න නම් මට ඒවට උත්තර දෙන්න පුළුවනි. තමුත් එතුමා කතා කරන්න ඕනෑ ඔබතුමාට තේද ගරු නියෝජ්‍ය කථානායකතුමනි ? ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ අපට වඩා කාලයක් සිටි කෙනෙක්.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කතා කරන්නේ ඔබතුමාටයි. මහරගම මන්ත්‍රීතුමාටත් ඇහෙනවා, එතුමාගේ කන් දෙපොළක තිබෙන නිසා. [බාධා කිරීම්]

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)
ඔය ඇමතිතුමාගෙන් උපදෙස් අරගෙන වාඩි වෙන්න.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
පන්සල් පිළිබඳව කථා කිරීමට මහරගම ගරු මන්ත්‍රීතුමාට අදහස් තැති වුණත් මට තිබෙනවා. පූජාවලිය, රාජාවලිය, නිකාය සංග්‍රහය, ධර්මප්‍රදීපිකාව

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)
ගජබින්නාලංකාරය !

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මේ ආදී ග්‍රන්ථ පහළ වුණේ එදා සිටි ලේඛකයන්ගේ වුවමනාවට නොවෙයි. එකල සිටි මන්ත්‍රීවරුන්ගේ වුවමනාවට නොවෙයි. තනිකරම රජ්ජුරුවන්ගේ වුවමනාවටයි. පොත්-පත් ලියන්න ලේඛකයන්ට ආරාධනා කළේ රජ්ජුරුවෝ. ඒ විධියට පොත් ලිවිවාට පස්සේ ඒවා සරසන ලද හස්ති රාජයකු පිට තබා ගමෙන් ගමට හන්දියක් හන්දියක් ගානේ ගෙන ගොස් කියවලා එදා ආගම දියුණු කරන්න රජතුමා කටයුතු කළේ ඒ ආකාරයට. සාහිත්‍ය ශාස්ත්‍ර, ශිල්ප ශාස්ත්‍ර, ආගම, කලා ශිල්ප ආදිය රටක දියුණු වන්නේ ඒවා රාජ්‍ය මට්ටමෙන් පිළිගැනුණු ආකාරයටයි.

තමන් වමේය කියා කෑගහන මේ ඇත්තෝ ආගමක් ගැන මෙතැන කතා කරන්නේ ජනතාව මුලා කරන්න. සම්පූර්ණයෙන්ම ජනතාව මුලා කරන්න. මෙයින් පිටතදී ශාස්ත්‍රීය දේශන පවත්වන විට මේ ඇත්තෝ, " ආගම තිකම් කෝට් ' එකක් අයිසේ, ඔකේ තේරුමක් නැහැ, අතීතය ආවර්ජනා කිරීම පමණක් මිස ආගමෙන් ඇති වන දියුණුවක් නැහැ " යි කියන ගමන් මහජනතාව මුලා කරන්න මෙතැන කියනවා පන්සල් දියුණු කරන්නය කියා. පිළිම වහන්සේලා වෙනස් කළ හැටි ගැන කතා කරනවා. මේ උදවිය මේ විහිළු කරන්නේ කාටද ? අවුරුදු හතළිහක් තිස්සෙ ඔහොම විහිළු කර කර ආපු මිතිසුන්ට පයින් ගහලා ඔවුන් පාර්ලිමේන්තුවෙන් එලියට පැන්නුවා, මේ රටේ ජනතාව 1977 දී.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)
ඒකම තමයි තමුත්තාත්සේලා ජන්ද නොතියන්නෙ ! ජන්ද තිබ්බොත් පයින් නෙමෙයි යන්න වෙන්නේ. ජන්ද තියලා බලන්නකෝ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
ඉහි නොදන්නා එකාට කෙළමෝලෙන් අතින්න ඕනෑය කියලා කතාවක් තිබෙනවා. ඒකත් ඉල්ලා අස්කර ගන්න කියයිද දන්නේ නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
සංවර්ධන සහා ජන්දත් කල් දමීමා. කිසිම ජන්දයක් නැහැ තමුන්නාන්සේලාට. ජන්දයක් තිබ්බොත් තේරෙයි. [බාධා කිරීම්] ඉල්ලා අස්වීමත් දිලා තියෙන්නේ.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
ජන්දය කියන එක නේරෙන්නෙ නැහැ මේ උදවියට.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
ලියුමක් දිලනෙ ඉන්නේ !

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
ජන්දය ගැන කතා කරන්නේ එයා ආවේ කොහොමද කියල දන්නේ නැතුව. තමුන්නාන්සේ මහරගමට ආවේ කොහොමද කියල මම දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇත්තන්ගෙ ඇස්වලට වැලි ගහලද මෙතැන ඇවිත්–

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
ඔය දේවල් කරුණාකර අමතක කරන්න.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි අපිව අවුස්සව ගන්නෙ ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
ඔවා යෝජනාවට අදාළ නැහැ.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
නැහැ, මෙය අදාළයි.

රවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)
මේ දවස්වල ටිකක් මොලේ තරකයි වගේ.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
තමුන්නාන්සෙත් අතුරු මැතිවරණයකිනුයි බලයට ඇවිත් තිබෙත්තෙ.

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)
I move,

"That the Debate be now adjourned."

*ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.*
*விஞ விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල්තබන ලදී.*
*එතැන් සිට විවාදය 1985 මැයි 10 වන සිකුරාදා පවත්වනු ලැබේ.*
*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம் 1985 மே 10, வெள்ளிக்கிழமை மீளத்தொடங்கும்.*
*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Friday, 10th May 1985.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)
These are some items of non-controversial Business which we would like to take up with the permission of the House.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Does the House agree ?

මන්ත්‍රීවරු
(அங்கத்தினர்)
(Members)
Aye !

## ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදින් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදින් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත

## இலங்கை உரோமன் கத்தோலிக்க அதிமேற்றிராணியார், மேற்றிராணியாளர்கள் (திருத்தம்) சட்டமூலம்

## ROMAN CATHOLIC ARCHBISHOP AND BISHOPS OF CEYLON (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிற்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)
I move,

"That the Bill be now read a second time".

*ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.*
*விஞ விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදීත්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

சட்டமூலம், இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, நிலைக் கட்டளை 48 (3)/52 இன் படி நிலைக் குழு "ஏ"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.

*Bill accordingly read a Second time, and allocated by* [MR. DEPUTY SPEAKER] *to Standing Committee "A" under Standing Order 48 (3).*

## ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

## பல்கலைக்கழக மகளிர் இலங்கைச் சம்மேளனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

## SRI LANKA FEDERATION OF UNIVERSITY WOMEN (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

(நிலையற் குழுவில்) திருத்தப்பட்டவாறு, பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for consideration, as amended (in the Standing Committee), read.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Report of the Standing Committee be accepted".

ප්‍රශ්නය විමසන ලදීත්, සභා සම්මත විය.
விஞ்ஞ விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Bill, as amended, be now read the Third time".

ප්‍රශ්නය විමසන ලදීත්, සභායම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

විඥ විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.

අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පෙට්‍රවාරු මූන්‍රුම් මුරෙයාක මතිප්පිටප්පට්‍රු නිරෙවේට්‍රප්පෙට්‍රදු.

*Question put, and agreed to.*

*Bill, as amended accordingly read the Third time, and passed.*

## දිවිතුර උත්තර පබ්බතාරාම විහාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

## திவிதுர உத்தர பப்பதாராம விகாரை அபிவிருத்திக் கழகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

## DIVITURA UTTARA PABBATHARAMA VIHARA SANWARDENA MANDALAYA (INCORPORATION) BILL

පනත් කෙටුම්පත සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for consideration, read.*

3–A 082484 (85/03)

පනත් කෙටුම්පත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරනු ලැබූ පරිදි සලකා බලන ලදී.

சட்டமூலம், நிலைக்குழு "பி"இனால் அறிக்கை செய்யப்பட்டவாறு பரிசீலிக்கப்பட்டது.

*Bill, as reported by Standing Committee "B" considered.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Bill be now read a Third time".

ප්‍රශ්නය විමසන ලදීත්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

விஞ்ஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## මාවනැල්ල එක්සත් බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

## மாவனல்ல எக்ஸத் பௌத்த சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

## MAWANELLA EKSATH BAUDDHA SAMITIYA (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවේදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

(நிலையற் குழுவில்) திருத்தப்பட்டவாறு, பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for consideration, as amended (in the standing Committee), read.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Report of the Standing Committee be accepted".

ප්‍රශ්නය විමසන ලදීත්, සභා සම්මත විය.
விஞ்ஞ விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Bill, as amended, be now read the Third time".

ප්‍රශ්නය විමසන ලදීත්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

விஞ்ஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பெற்றவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

මා මේ ප්‍රශ්නය අසන්නට බලාපොරොත්තු වන්නේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමාගෙනුයි. ලංකා වානේ සංස්ථාවේ අංශයක් එතුමාගේ අමාත්‍යාංශයට පැවරීමෙන් පසුව එම වානේ සංස්ථාවේ සේවකයන් ගණනාවක් සේවය කරන සේවා අංශ කීපයක් වසා දැමීමට තුඩු දෙන තර්ජනයක් මතුවී තිබෙනවා. එක් උදාහරණයක් හැටියට මම ඉදිරිපත් කරන්න කැමතියි, වානේ සංස්ථාවේ සේවකයන්ට හදිසියේම නියෝගයක් ඇවිත් තිබෙනවා, එහි වෙළඳ අංශය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අනුමත කළාය, එම අංශයේ ඉන්න සේවකයන් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සේවයට යා යුතුය කියා. මෙය මම හිතන විධියට හොඳ සම්ප්‍රදායක් නොවෙයි. මේ වාගේ තවත් අංශ කිහිපයක් වැසී යන තර්ජනයක් තිබෙන බවයි පෙනෙන්නේ. රජය, කැබිනට් මණ්ඩලය, තීරණය කර තිබෙනවා ඒ වානේ සංස්ථාවට ගෙනෙන ලද පරණ යකඩ තවදුරටත් පාවිච්චි නොකර විදේශ ඇණවුම් කැඳවලා විකුණන්නට ඕනෑය කියා. එහි සත්‍ය අසත්‍යතාවයයි මම මේ වෙලාවෙ අහන්නෙ.

වානේ සංස්ථාවේ අංශ ගණනාවක් තිබෙනවා. කම්බි නිෂ්පාදනය කරන අංශය ආදී වශයෙන්. මේ ආකාරයෙන් අංශ ගණනාවක්ම ඉදිරි කාලයේදී වෙනස් වූ ප්‍රතිපත්තිමය සංවර්ධනයකට ලක් කරන්න බලාපොරොත්තු වෙනවාද ? එසේ නැත්නම් ඒ අංශ වසා දැමීමට බලාපොරොත්තු වෙනවාද ? මේ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරනවා නම් හොඳයි. මොකද, දැනට වානේ සංස්ථාවේ සේවයින් තුළ විශාල සැකයක් හා බියක් ඇති වී තිබෙනවා හදිසියේම මේ එක අංශයක් බීඑම්සී එකට — ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට — අනුයුක්ත කර සේවකයන්ට සේවය සඳහා එතැනට යන්නට කීම නිසා. මේ නිසා අනෙක් අංශවල සේවකයින් විශාල බියකට පත්වෙලා තිබෙනවා, වානේ සංස්ථාව කොටස්වලට කැඩීම නිසා තමන්ගේ අනාගතයට මොනවා වෙයිද කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම වානේ සංස්ථාව කාලයක් තිස්සේ දියුණු වෙමින් මේ රටේ කර්මාන්ත දියුණුවට අවශ්‍ය යකඩ හා වානේ සැපයුවා. ඕනෑම රටක කර්මාන්ත දියුණුවේ පදනම රඳා පවතින්නේ යකඩ හා වානේ කර්මාන්තයේ දියුණුව මතයි. යන්ත්‍රෝපකරණ හා ඒවාට අවශ්‍ය අනිකුත් වානේ හා යකඩ නිෂ්පාදන තිබුණොත් තමයි කර්මාන්තවලට නියම පදනමක් වැටෙන්නේ. එනිසා වානේ සංස්ථාවේ දෙවැනි හා තුන්වැනි අදියරවල තිබෙන අන්දමට ඒ නිෂ්පාදන කටයුතු කරගෙන යාමට තිබුණු බලාපොරොත්තුවේ වෙනසක් ඇතිකර තිබෙනවාද ? වානේ සංස්ථාවේ තවත් අංශ කිහිපයක් වහන්නට බලාපොරොත්තු වෙනවාද ? නැත්නම්, මේවා වෙනත් දෙපාර්තමේන්තුවලට පවරන්නට බලාපොරොත්තු වෙනවාද ? ඒ තුළින් සේවකයන් සම්බන්ධයෙන් උදාවෙන තත්ත්වයට මොකක්ද කරන්නට බලාපොරොත්තු වෙන්නේ ? මේවා ගැන ප්‍රකාශයක් ගරු ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

තවත් ප්‍රශ්නයක් තිබෙනවා ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මම පසුගියදා එය ගරු අධිකරණ ඇමතිතුමා වෙත ඉදිරිපත් කළා. ඒ තමයි තිස්සමහාරාම මහෙස්ත්‍රාත් උසාවිය. එය දැනට පවත්වාගෙන යන්නෙ හම්බන්තොට.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The Deputy Chairman of Committee will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩිමන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. DEPUTY SPEAKER left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMAWICKREMA" *took the Chair.*

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තිස්සමහාරාම මහෙස්ත්‍රාත් උසාවිය හම්බන්තොටට ගෙනාවාට පසුව, පසුගිය සඳුදා මතුවූ අර්බුදයකදී එම මහෙස්ත්‍රාත්වරයා විසින් දුන් නියෝගයක් උඩ—මම මේ කරුණු අභ්‍යන්තරයට සොයන්නට යාම සුදුසුය කියා මම හිතන්නෙ නැහැ—නීතිඥ වීරසූරිය මහතාට ඒ උසාවියෙන් දුන් නියෝගයක් උඩ, මුළු නීතිඥ මණ්ඩලයම ඒකට විරෝධය පළකරමින් ඉවත ගිහින් තිබෙනවා. ඒ අනුව උසාවියේ කිසිම නීතිඥවරයෙක් නැහැ, විත්තිකරුවන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්නට. එය එසේ වුවත් නඩු අසාගෙන යනවා.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය මෙහෙමයි :

" වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේ ය. "

මේක මූලික අයිතිවාසිකමක්. තමන් වෙනුවෙන් නීතිඥයෙක් තබාගැනීමට තිබෙන අයිතිය මූලික අයිතිවාසිකමක්. ඒ තත්ත්වය දැනට ඒ උසාවියේ අහෝසිවෙලා තිබෙනවා. මම හිතන්නෙ මේ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයටත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමාටත්, අධිකරණ සේවා කොමිෂන් සභාවටත් එහි නීතිඥ සංගමයේ ලේකම්වරයාත්, නීතිඥ සභාවමත් දැනුම් දී තිබෙනවා.

ඒ වාගේම මේ නීතිඥවරයා උසාවියෙන් ඉවත් කිරීමට පොලීසියටයි නියෝග කර තිබෙන්නේ. දැනගන්නට තිබෙන තොරතුරු අනුව, මෙම නීතිඥවරයාගේ විරුද්ධත්වය මධ්‍යයේ පොලීසිය ඔහුව උසාවි ගර්හයෙන් ඇදගෙන ගිහින් තිබෙනවා.

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට තවත් වගන්ති ගණනාවක් තිබෙනවා. ඒ ගැන මම මේ වෙලාවේ සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. " Criminal Procedure Code " 260 සහ " Judicature Act " යන නීති විධිවිධාන අනුව තමන් වෙනුවෙන් පෙනී සිටින්නට නීතිඥයෙක් ඉදිරිපත් කිරීමට හෝ එසේ නැත්නම් තමන්ගේ නිදහසට කරුණු කියා සිටින්නට අවස්ථාවක් දීමක් හෝ එතැන නැහැ. ඒ නිසා යුක්තියේත් සාධාරණයේත් නාමයෙන් මේ ගැන මැදිහත් වෙන්නය කියා මම ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. හලීම් ඉෂාක් මහතා (මැද කොළඹ තුන්වන)
(ஜனாப் எம். ஹலீம் இஸாக் — கொழும்பு மத்தி மூன்றாம் அங்கத்தவர்)
(Mr. M. Haleem Ishak–Third Colombo Central)

On the first matter raised by the hon. Member for Maharagama regarding the Steel corporation, I also with to speak a few words pertaining to the same Ministry, the Ministry of Local Government, Housing and Construction.

There is a shortage of cement in the market, Sir, and already there is a blackmarket where cement supplies are concerned. I am informed that after the Building Materials Corporation took over the distribution they have terminated the services of some of the retail outlets in the city.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please! Have you given notice of this Question?

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

I am speaking on the matter that has been raised by the hon. Member for Maharagama which comes under the same Ministry, the Ministry of Local Government, Housing and Construction. This is a Debate and I can take part in it, Sir. Even if the hon. Deputy Minister is unable to answer me today, on a later occasion he could give an answer on this matter.

I only appeal to the hon. Deputy Minister to look into this matter regarding the distribution of cement from retail outlets. Quite a number of agencies of retail dealers who are agents or distributors has been terminated or cancelled as a result of which there is a scarcity of cement in the market, especially where retail sales are concerned.

I kindly request the hon. Deputy Minister to look into this matter and see that a proper distribution is done, especially where the retailers are concerned.

අමරසිරි දෙඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda–Baddegama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී ඇසීමට ප්‍රශ්න තුනක් කල් දී තිබෙනවා. පළමුවෙනි ප්‍රශ්නය මිගමුව ආසනයේ තලාගේන ශාන්ත බාර්බරා මුනිවරයාගේ දේවස්ථානයට අයත් ඉඩමේ පදිංචිකරුවන් බලහත්කාරයෙන් ඉවත් කිරීමට තර්ජනය කිරීම ගැන ගරු අග්‍රාමාත්‍ය, පළාත් පාලන, නිවාස හා ඉදි කිරීම් ඇමතිතුමාගෙන් ඇසීමටයි.

එම ඉඩමේ අවුරුදු 40 කටත් අධික කාලයක් තිස්සේ ධීවර හා අනිකුත් සුළු කර්මාන්ත ඉතා සාමකාමීව ජීවත්වන අසරණ පදිංචිකරුවන් කිසියම් බලගතු පිරිසක් විසින් බලහත්කාරයෙන් ඉවත් කිරීමට යන බව දැනගන්නට තිබෙනවා. මේ පිළිබඳව පදිංචිකරුවන් ජාතික නිවාස කොමසාරිස්තුමාට පැමිණිලි කිරීමෙන් පසු, පදිංචිකරුවන් සහ ඔවුන් පදිංචි ස්ථාන සම්බන්ධයෙන් අවශ්‍ය ආරක්ෂාව ලබාදෙන ලෙසට ජාතික නිවාස කොමසාරිස් විසින් මිගමුව පොලිස් ස්ථානාධිපති තැනට ලිඛිතව දන්වා තිබෙනවා. ජාතික නිවාස කොමසාරිස් එයේ දන්වා ඇත්තේ එකී ස්ථානවල සම්පූර්ණ අයිතිය ඔහු සතු බැවිනුයි. මේ ගැන අපක්ෂපාති පරීක්ෂණයක් පවත්වා සාමකාමීව ජීවත් වන පදිංචිකරුවන්ට එහි ස්ථිර පදිංචිය ලබාදීමට එතුමා සාධාරණ ක්‍රියාමාර්ගයක් ගත්තවාද කියා මම ප්‍රශ්න කරනවා.

දෙවනි ප්‍රශ්නයත් මම යොමු කරන්නේ අග්‍රාමාත්‍ය, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා වෙතයි. මෙම ප්‍රශ්නය හාලිඇල මැතිවරණ කොට්ඨාශයේ බැද්දේගම සීතල කඳුරේ සහ නිල්ලගොඩ කඳුරේ ජලය බදුල්ල නගරයට ගෙන යාමේ යෝජනා ක්‍රමය සම්බන්ධවයි.

බදුල්ල නගරයට ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ හොත් දැනට එම ප්‍රදේශයේ දෙකන්තයේම වගා කරන කුඹුරු අක්කර 300 ක් පමණ වැනසී යාමටත් ඒ හේතුවෙන් ගොවි පවුල් 1000 ක් පමණ අනාථ වීමටත් ඉඩ ඇති නිසා රිල්පොල කෝරලයේ ඒකාබද්ධ ගොවීන්ගේ සංගමය මෙම යෝජනා ක්‍රමයට බලවත් විරෝධතාවය ප්‍රකාශ කොට තිබෙනවා. මෙම විරෝධතාවය 1985.01.04 වන දින " දවස " පත්‍රයේ " තල මගින් බදුලු නගරයට ජලය ගත හොත් කුඹුරු අක්කර 300 කට හානි–සැලසුම් නවත්වන්නැයි ගොවීන්ගෙන් ඉල්ලීමක් " යන මාතෘකාව යටතේද පළ වී තිබෙනවා. තවද මෙම යෝජනා ක්‍රමය අත්හිටුවීමට තීරණය කළ බව බදුලු දිස්ත්‍රික් අමාත්‍යාංශය මගින් 1980.04.23 වන දින දරණ ලිපිය මගින් ගොවි පෙරමුණේ ලේකම්වරයාටද දන්වා තිබෙනවා.

තත්ත්වය මෙසේ තිබියදී මෙම ජලයෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රදේශයේ ගොවීන්ට විශාල පාඩු සිදුවන නිසා මෙම යෝජනා ක්‍රමය නතර කිරීමට එතුමා කටයුතු කරනවාද, නො එසේ නම් ඒ මත්ද කියා මම ප්‍රශ්න කරනවා.

මගේ තුන් වැනි ප්‍රශ්නය ඇසීමට තිබෙන්නේ ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමාගෙනුයි. මේ අවස්ථාවේදී එතුමා මේ ගරු සභාවේ නොසිටීම ගැන මම කනගාටු වෙනවා. ඒ මොකද කීවොත්, මේ ප්‍රශ්නය අද රට පුරාම බලපා තිබෙන එකක් නිසයි. මේ ප්‍රශ්නයට අදළව දැනටමත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා පාඨශාලා ශිෂ්‍යයන් සැහෙන සංඛ්‍යාවක් පොලිස් අත්-අඩංගුවේ සහ රිමාන්ඩ් භාරයේ පසු වෙනවා. ඒ නිසා ඒ අය අතුරින් කිප දෙනකු සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරන්න අදහස් කරනවා.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ රුහුණු මණ්ඩපයේ ශිෂ්‍යයන් එකොළොස් දෙනෙක් තංගල්ලේ රිමාන්ඩ් භාරයේ පසු වෙනවා. ඒ ගැන පොලිසියෙන් විමසූ විට කියන්නේ ඔවුන් එසේ රිමාන්ඩ් භාරයේ තබා ඇත්තේ හදිසි නීතිය යටතේ බවයි. ඒ ශිෂ්‍යයන් පමණක් නොව දිවයිනේ දිස්ත්‍රික් රැයක ශිෂ්‍යයන් ඒ විධියට රිමාණ්ඩ් භාරයේ පසුවෙනවා. ගොකරුල්ල පොලිසියේන්, තෝටන්බ්‍රිජ් පොලිසියේන්, ජා–ඇල පොලිසියේන්, රහස් පොලිසියේන් ඒ විධියට ශිෂ්‍යයන් කිප දෙනෙක් අත්-අඩංගුවේ පසුවෙනවා. ඒ විධියටම දේශීය වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයන් කිප දෙනෙක් වැලිකඩ පොලිසියේන්, රුහුණු විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් කිප දෙනෙක් මාතර බන්ධනාගාරයේන්, රෝහණ විද්‍යාලයේ කිප දෙනෙක් මාතර පොලිසියේන්, අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ ශිෂ්‍යයන් අට දෙනෙක් අම්බලන්ගොඩ පොලිසියේන්, දික්වැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයන් කිප දෙනෙක් දික්වැල්ල පොලිසියේන් ආදී වශයෙන් ගතළිහකට ආසන්න ශිෂ්‍යයන් පිරිසක් පොලිස් අත්-අඩංගුවට අරගෙන තිබෙනවා; සමහරුන් රිමාණ්ඩ් භාරයට පත් කර තිබෙනවා.

මේ ගරු සභාවේ දැන ගැනීම සඳහා මේ අවස්ථාවේදී මා කැමතියි, ඒ ශිෂ්‍යයන් කර තිබෙන වරද මොකක්දැයි පෙත්තා දෙන්න. තව විශ්වවිද්‍යාල සංශෝධන පනත අනුව තමන්ට සිදු වන හානි ගැන කරුණු සඳහන් කරමින් "ඔබ දරුවන්ගේ උසස් අධ්‍යාපන බලාපොරොත්තු යුත්ත වෙයිද?" යන මාතෘකාව යටතේ ඒ අය පත්‍රිකාවක් බෙදා හැර තිබෙනවා. ඒ පත්‍රිකාවේ වැඩිදුරටත් මෙසේ සඳහන් වී තිබෙනවා:

"ධනේශ්වර පංතියේ දරුවන්ට පමණක් සීමා වී තිබූ උසස් අධ්‍යාපන වරප්‍රසාද දුප්පත් ජනතාවගේ දරුවන්ටද ලබා ගත හැකි වන පරිදි, හිටපු අගමැති ඇස්. ඩබ්ලිව්. ආර්. වී. බණ්ඩාරනායක මහතා විසින් ආරම්භ කරන ලද වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම විනාශ කර දැමීමේ අරමුණින්, මැතකදී ලඟී-ලඟීයේ මෙම රජය විසින් සම්මත කරන ලද සරසවි පනත් සංශෝධන නිසා විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන් මෙන්ම ආචාර්යවරුන් අතරද මහත් ආන්දොලනයක් පැන නැඟී ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දෙඩන්ගොඩ මහතා]

අප කවුරුත් මේ තත්ත්වය ගැන ඉතා කල්පනාකාරීව අවධානය යොමු කළ යුත්තේ, රටක දරුවන්ගේ අනාගතය ගැන දේශපාලන, ආර්ථික, සාමාජික හා අනෙකුත් බෙදයන්ගෙන් තොරව සලකා බැලිය යුතු නිසායි.

අප කවුරුත් දන්නා පරිදි මේ රටේ දක්ෂකම් ඇති දරුවනට ධනය, සමාජ තත්ත්වය නෝ වෙනත් කරුණු සැලකිල්ලට නොගෙන විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීමට නිදහස් අධ්‍යාපන ක්‍රමය මගින් මග පාදා තිබේ. දිගු කලක් ලැබුණු මේ පිටිවහල නිසා උසස් අධ්‍යාපනයක් ලබා ගෙන මෙරට මෙන්ම පිටරටද විවිධ වෘත්තීන්වලට අදලව උසස් ථානාන්තරවල යෙදෙනත්නට දුප්පත් මෙන්ම මධ්‍යම පාන්තික පවුල්වලට වැඩි-වැඩියෙන් ඉඩකඩ ලැබී තිබුණි.

මේ තත්ත්වයට යම් විධියකින් හානියක් දනට සම්මත කොට ඇති සංශෝධකවලින් මොනයම් විධියකින් හෝ සිදු වනවා නම් ඒ තත්ත්වය සාධාරණ අත්දමින් වෙනස් කරලීමට උනන්දුවීම දෙමවුපියන්ගේත් අනෙක් පුරවැසියන්ගේත් යුතුකමයි.

නව සංශෝධන ගැන කරුණු තිවැරදි ලෙස විග්‍රහ කරන විට පෙනී යන ඒවායින් පැන නැඟිය හැකි අහිතකර ප්‍රතිඵලවලින් කීපයක් පහත සඳහන් කරමු.

දනට මහජන මුදල්වලින් නඩත්තු වන විශ්වවිද්‍යාලවලට අමතරව පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ වීමට ඉඩ තිබීමෙන් අහිතකර තරඟයක්, පොදු ආයතනත්, පෞද්ගලික ආයතනත් අතර ඇති වීමට ඉඩ තිබේ.

මෙවැනි තරඟයක් ඇති වුන විට මහජන මුදලින් නඩත්තු වන විශ්වවිද්‍යාලවලට වඩා මුදල් අය කොට උසස් අධ්‍යාපනය දීමට කටයුතු කරන පෞද්ගලික ආයතනවලට වැඩි වාසියක් ලැබීමට ඉඩ සැලසේ.

උදාහරණ වශයෙන් ගතහොත්, දනට පවතින විශ්වවිද්‍යාලවල සිටින මහාචාර්ය – ආචාර්ය කණ්ඩායම පෞද්ගලික ආයතනවලට යොදවා ගත හැකි වීමෙන්, අහිංසක පවුල්වලින් පොදු විශ්වවිද්‍යාල වලට ඇතුළුවී සිටින දරුවන්ගේ අධ්‍යාපනය දුර්වල වනු ඇත. මෙයට හොඳම සාක්ෂියක් ලෙස මෑතකදී පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීමෙන්, පොදු මුදලින් නඩත්තු වන වෛද්‍ය පීඨ දෙකට මුහුණ පෑමට සිදු වී ඇති දුෂ්කරතා පෙන්විය හැකියි.

පෞද්ගලික විශ්ව විද්‍යාල බිහි වුණු විට ඉගැන්වීමේ තත්ත්වය තිසියාකාර පාලනය නොවීමෙන්, මුදල්වල බලයෙන් උපාධිය ලබා ගැනීමේ පිළිවෙතක් ක්‍රියාත්මක වීමට ඉඩ තිබේ. එවිට රට තුළත් පිටරටත්, අපගේ දරුවන් මෙතෙක් කල් ලැබූ සහ ඉදිරියට ලබා ගැනීමට බලාපොරොත්තු වන උපාධිවලට තිබෙන පිළිගැනීම නැතිවී යනු ඇත. එයින් වැඩි පහර වදින්නේ උපාධිය ලබා ගෙන හොඳ රැකියාවක් කිරීමට බලාපොරොත්තු වන දුප්පත් සහ මධ්‍යම පන්තිවල දරුවන්ටය. අනෙක් අතට ඉහළ තත්ත්වයෙන් අධ්‍යාපනය සැලසීම සඳහා වෙන් වූ පෞද්ගලික විශ්වවිද්‍යාල ඉතා ඉහළ ගාස්තු අය කරමින් උපාධි පිරිනැමීමට කටයුතු කළ විට, මුදල් ඇති අය ලබා ගන්නා උපාධිවලත්, මුදල් නැති අය ලබා ගන්නා උපාධිවලුත් පරතරය රැක ගැනීමේතත්ත්වයක් ඇති වීමෙන් දුප්පත් සහ මධ්‍යම පංතියේ පවුල්වල දරුවන් දෙවැනි මවටමේ උපාධි ලැබූවන්ගේ ගණයට වැටීමට ඉඩ තිබේ.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යටත්විජිත කාලයේ තිබුණු ආකාරයට අහිංසක පවුල්වල දරුවන් ලිපිකරු සහ සුදුසේවා තනතුරුවලටත්, මුදල් ඇති පවුල්වල දරුවන් රජයේ මෙන්ම අනෙකුත් අංශවල ලොකු තනතුරුවලටත් පත්වීම නැවත ඇරඹෙනු ඇත."

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)
You can table this document.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)
I will take only three minutes more, Sir.

"රජයේ විවිධ සංස්ථා මගින් සැපයූ සේවාවන් පෞද්ගලික අංශයට භාරදීමට ගත් පියවර නිසා ඒවා ක්‍රමානුකූලව විනාශ මුඛයට ලක්වීමට පටන්ගෙන ඇති පරිදිම ඔබගේ දරුවාට මුදල් නොගෙවා උසස් අධ්‍යාපනය ලබාගත හැකි පොදු විශ්ව විද්‍යාලද විනාශයට පත්වීම පෞද්ගලික විශ්ව විද්‍යාල ආයතන බිහිවීමෙන් අවශ්‍යයෙන්ම සිදුවනු ඇත.

නව අතකින් බැලූ විට නව සංශෝධන නිසා විශ්ව විද්‍යාල තුළ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ඉතා සියුම් ලෙස ඉවත් කෙරෙනු ඇත. උදාහරණ වශයෙන් උපකුලපතිවරුන් පත්කිරීමේදී ජන්ද බලයෙන් ඉතා සාධාරණ ලෙස කරනු ලැබූ තේරීම් මින් පසු ජනාධිපතිතුමාගේ ව්‍යවමතාවත් හා කැමැත්ත අනුව කෙරෙනු ඇත.

මේ හේතුවෙන් කෘතහස්ත විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් වෙනුවට රජයේ ඵජත්තවරුන්ටත් වඩා යටහත් අය මේ තිලතලවලට පත්වනවා ඇත. එවිට ඉගැන්වීම්, පරිපාලනය, පර්යේෂණ ආදී කටයුතුවලට දිය හැකි මතා මග පෙන්වීම අඩුවනවාට කිසිදු සැකයක් නැත.

දනට ඉතා ලාබාල, අත්දකීමෙන් අඩු උපකුලපතිවරුන් පත් කිරීම රජය අරඹා තිබෙන බව තනු දන්නෝ අවබෝධ කරගෙන සිටිති.

මේ හේතුව නිසා බුද්ධිය මුහුකුරාගිය අත්දකීමෙන් යුතු අයගේ සේවය විශ්ව විද්‍යාලවලට ලබාගැනීමට බැරිවනු ඇත. තවද ආචාර්ය මණ්ඩල අතර, කලකිරීමක් ඇති වී අනවශ්‍ය බෙදීම් හට ගැනීමෙත් ඔබගේ දරුවන්ගේ උසස් අධ්‍යාපනය බාධාකාරීවනු ඇත.

මීට අමතරව මහා ශිෂ්‍ය සංගම් සකස් කරන ආකාරය වෙනස් කිරීම නිසා ශිෂ්‍ය නියෝජිතයා බාල්දුකොට ශිෂ්‍යයින්ට නිදහස් අදහස් දක්වීමට තිබෙන අවස්ථා සීමා සෙරේ. ශිෂ්‍යයින්ගේ කටයුතු මනුපිටින් මේ ආකාරයට පාලනය කිරීමට පියවර ගැනීම නිසා රහසිගත ව්‍යාපාර හා අනවශ්‍ය ගැටුම් හා අවුල් ඇතිවනු නියතය."

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
(Mr. Harindra Corea)
On a point of Order, Mr. Deputy Chairman, can I ask whether this is a question raised by the hon. Member or whether it is a written statement, or is it a printed copy ?

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
(Mr. Amarasiri Dodangoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය තිබෙත්තේ විශ්ව විද්‍යාල සියුන් අත්අඩංගුවට ගැනීම ගැනයි.

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
(Mr. Harindra Corea)
I know what you are saying, but is this a circular or something which is issued ? This is on a point of Order. I want to know what he is reading.

**අනිල් මුණසිංහ මහතා (මතුගම)**
**(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)**
(Mr. Anil Moonesinghe–Matugama)
No. That is not a point of Order.

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
(Mr. Harindra Corea)
It is a point of Order.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)
Under what Standing Order are you raising it ?

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
(Mr. Harindra Corea)
I want to know what he is reading. If he is reading from a document, we are entitled to know what it is.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)
I think it is better for the hon. Member to table it.

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
(Mr. Harindra Corea)
If he is reading from some document, we are entitled to know what it is.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
You can table it, please.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ශිෂ්‍යයින් අත්අඩංගුවට ගැනීමට අදලව බෙදුවාසයි කියන පත්‍රිකා මගින් කිසිම හදිසි නීති කඩකිරීමක් හදිසි නීති කඩකිරීම් සිදු වී නැහැ. එම නිසා මා මෙය* සභාගත කරනවා.

දැනට අත්අඩංගුවේ සිටින මෙම ශිෂ්‍යයින් මහා දරුණු අපරාධකරුවන් ලෙස මෙසේ රිමාන්ඩ් භාරයේ තබා ගැනීම බලවත් අසාධාරණයක්. එම නිසා මා ජාතික ආරක්ෂාව පිළිබඳ ගරු අමතිතුමාගෙන් දැන ගැනීමට කැමතියි, මෙම සිසුන් නිදහස් කරන ලෙසට එතුමා උපදෙස් දෙනවාද, නොඑසේ නම් ඒ මන්ද කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
Now the hon. Member for Akmeemana can speak.

**රිවඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය ඇසීමට කලින් බද්දේගම ගරු මහජන මන්ත්‍රීතුමා (අමරසිරි දෙඩන්ගොඩ මහතා) අසන ලද ප්‍රශ්නයට අදල කරුණු කිහිපයක් මතු කරන්න මම කැමතියි. විශේෂයෙන්ම පසුගිය දිනවල විශ්ව විද්‍යාල පනතට එරෙහිව මේ රටේ ඇති වූ ව්‍යාපාරවලදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවක් පොලිසිය විසින් අමානුසික ලෙස අත්අඩංගුවට ගෙන තිබෙනවා. පොලිසිය මෙම අවස්ථාවේදී ඉතාම දරුණු ආකාරයෙන් පහරදීම නිසා බෞද්ධ භික්ෂූන් වහන්සේලා, ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවකට තදබල ලෙස තුවාල සිදු වී තිබෙනවා. විශ්ව විද්‍යාල පනත පිළිබඳ විවාදයේදී අපි පාර්ලිමේන්තුවේදී සඳහන් කළා, මෙය පාර්ලිමේන්තුව විසින් පනවන ලද ප්‍රතිගාමී පනතක් හැටියට. මේ පනතට විරුද්ධව—[බාධා කිරීමක්]

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
මේ පනත විවාද කරල අවසානයි. දැන් මොකද පනත ගැන කථා කරන්නේ ?

**රිවඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ කථා කරන්නේ බද්දේගම ගරු මහජන මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට අදලව විනාඩි තුන හතරක් පමණයි.

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා (නියෝජ්‍ය පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා)**
**(திரு. எம். டீ. பிரேமரத்ன — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)**
(Mr. M. D. Premaratne–Deputy Minister of Parliamentary Affairs & Sports)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපටත් ඉඩ දෙනවද කථා කරන්න ?

* පුස්තකාලයේ තබා ඇත.
நூலிலயத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

4–A 082484 (85/03)

**රිවඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)
දැනට හිර හාරයට අරගෙන තියෙන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සියළු දෙනාම වහාම නිදහස් කරන ලෙස මේ ගරු සභාව මාර්ගයෙන් මම ඉල්ලා සිටිනවා. මම මේ අවස්ථාවේදී මේ කාරණය සඳහන් කරන්නේ මේ නිසයි. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් හෝ ගුවන් විදුලිය මාර්ගයෙන් හෝ රූපවාහිනිය මාර්ගයෙන් හෝ කිසිම විධියකින් අදහස් ප්‍රකාශ කරන්නට කිසිම මති මතාන්තරයක් ඉදිරිපත් කරන්නට විරුද්ධ පක්ෂයට අද අවස්ථාවක් නැහැ. [බාධා කිරීම්] අපිට අදහස් ප්‍රකාශ කරන්නට තිබෙන එකම ස්ථානය මෙම ගරු සභාව පමණයි. එමනිසා අපේ අදහස් ප්‍රවෘත්ති පත්‍රවල පල කිරීම සඳහා මේ ගරු සභාවේදී කිව යුතුව තිබෙනවා. [බාධා කිරීම්]

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා**
**(திரு. எம். டீ. பிரேமரத்ன)**
(Mr. M. D. Premaratne)
අපි කාරණයක් දැන ගන්නට කැමතියි. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දෙඩන්ගොඩ මහතා) ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව අක්මීමන ගරු මන්ත්‍රීතුමාට කථා කරන්නට ඉඩ දෙනවා නම් ඒ පිළිබඳව අනෙක් මන්ත්‍රීවරුන්ටත් කථා කරන්නට අවස්ථාවක් දෙනවාද ?

**රිවඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)
එම නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හිර හාරයට අරගෙන සිටින සියළු දෙනාම කොන්දේසි විරහිතව ඉතාම සාධාරණ ලෙස නිදහස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා**
**(திரு. எம். டீ. பிரேமரத்ன)**
(Mr. M. D. Premaratne)
මේ කාරණය පිළිබඳව අක්මීමන ගරු මන්ත්‍රීතුමාට කථා කරන්නට ඉඩ දෙනවා නම් අනෙක් මන්ත්‍රීවරුන්ටත් කථා කරන්නට ඉඩ දෙනවාද ?

**රිවඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)
ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීම සඳහා මම ප්‍රශ්නයක් කල් දී තිබෙනවා. අක්මීමන ආසනයේ රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් පාලනය කරනු ලබන වලහන්දුව වත්තේ ගිනිකුරු කම්හලක් ආරම්භ කිරීමට පසුගිය රජය විසින් ගොඩකැඟිලි ආදිය හදලා සියළුම කටයුතු අවසන් කර තිබුණා. 1977 වර්ෂයේදී මේ රජය බලයට පත්වන විට මේ කටයුත්ත තිම කරලයි තිබුණේ. පසුව මෙම ගිනිකුරු කම්හල විවෘත කළා. විවෘත කරලා එහි වැඩ කරගෙන ඇවිත්, පසුගිය දවස්වල එම කම්හල වසා දැම්මා. මේ ගිනිකුරු කම්හල වසා දැම්ම නිසා එම කර්මාන්ත ශාලාවේ වැඩ කළ සේවකයින් එකසිය තිස් ගණනකට රැකියා නැති වුණා. මෙම ගිනිකුරු කම්හලෙන් අලාභයි කියලා මේ විධියට එක පාරටම වසා දැමූ නිසා එකසිය ගණනකට රැකියා නැති වුණා. මේ ගිනිකුරු කර්මාන්ත ශාලාව වසා දැම්ම ගැන පසුගිය දවසක මම මේ ගරු සභාවේදී කථා කළා. දැන් සිදු වී තිබෙන්නේ මෙයයි : මෙම කම්හලේ තිබුණු මැෂින් සියල්ලම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ නියෝගයක් පිට කොළොන්ත ආසනයට ගෙන ගොස් තිබෙන බව මට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ ගැන අඩු ගණනේ මේ රජයේම ගාල්ලේ ගරු දිසා ඇමතිතුමාටවත් දන්වා නැහැ. ඒ ගැන පළාතේ මන්ත්‍රීවරයා වන මටවත් දන්වා නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේ ගැන කියන්නට දෙයක් නැහැ. තමුන්නාන්සේ එක්වරක් ගෙවුඩ විකුණන්නට ගිහිල්ලා වුණු දේ මතක නේද ? ගරු ජනාධිපතිතුමා තමුන්නාන්සේට ඩිමෝෂන් එකක් දුන්නා. ඊට පස්සේ හතර ගානෙන් දලා වැදලයි ආපහු ඒක ගත්තේ—

එම නිසා මෙම ගිනිකුරු කර්මාන්ත ශාලාව වසා දැම්ම වහාම නතර කර නැවත වතාවක් මෙම ස්ථානයේ මෙම කර්මාන්ත ශාලාව ආරම්භ කර ඒ සේවකයන්ට රක්ෂා ලබා දීමට පියවර ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්න කිපයක් ඇසීම සඳහා මම කල් දී තිබෙනවා. එයින් පළමුවන ප්‍රශ්නය, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමටයි, මම බලාපොරොත්තු වන්නේ.

ජාතික නිවාස කොමසාරිස්තුමාගේ ගෙ. කු. ප. 5/3/2 විවිධ දරණ අංකය යටතේ මීට අදල තොරතුරු සඳහන් වෙනවා. ප්‍රශ්නයට අදල විස්තර මෙසේයි : එච්. ඩී. ආර්. ජොසප්ත්, "වාර්ල්ස්ටන්" අංක 277, පරණ නුවර පාර, කැළණිය. යන අය පදිංචිව සිටින නිවසින් කොටසක් බලහත්කාරයෙන් නීති විරෝධීව කඩා දමා ඇත.

දැනට ඉතිරිව ඇති නිවෙසේ තම දු දරුවන් ඇතුළු හත් දෙනෙකු පමණ ජීවත් වීමට අපහසු තත්ත්වයකට පත් කර ඇත. කිසිම උසාවි නියෝගයක් නොමැතිව පිස්කල් නිලධාරියෙකුත්, වත්තල පොලීසියේ ස්ථාන භාර පරීක්ෂක දයා සෙනෙවිරත්න මහතාගේ මෙහෙයැවීමෙන් එම පොලීසියේ පොලිස් කොස්තාපල් 13571 දරණ පොලිස් නිලධාරියාද ගවුල්ව නිවසට ගොස් තර්ජනය කර ගෙයි ඉදිරිපස කඩා දමා විනාශ කර ඇත. උසාවියේ නියෝගයක් නොලබා පිස්කල් නිලධාරියෙකුට හෝ පොලිස් නිලධාරියෙකුට හෝ පුද්ගලික නිවසක් කඩා බිඳ දමා නිවැසියන්ට අලාභ හානි කිරීමට හැකියාවක් නැත.

ඒ අනුව මා අසන ප්‍රශ්නය මෙයයි : ඉහත කී කරුණු ගැන ගරු අගමැතිතුමාගේ කාරුණික අවධානය යොමු කර විධිමත් පරීක්ෂණයක් කර නීති විරෝධී වැඩ කර ඇති නිලධාරීන්ට විනයානුකූලව දඩුවම් දීමට කටයුතු කරත්තේද ? නො එසේ නම් ඒ මන්ද ?

මේ කාරණය සම්බන්ධව පොඩි විස්තරයකුත් ඒ තැනැත්තිය විසින් මට ලියා එවා තිබෙනවා. ඒ ගෙය කඩා දමා තිබෙන ආකාරය දැක්වෙන ඡායාරූපයකුත් එවා තිබෙනවා. ඒ ගෙයින් අඩි 25 × 18 ප්‍රමාණයේ කැල්ලක් කඩා දමා තිබෙනවා. ඒ උදවියට දැනට පදිංචි වීම සඳහා ඉතිරි වී තිබෙන්නේ ඒ ගෙයින් අඩි 14 × 8 ප්‍රමාණයේ කොටසකුයි. ඒ කොටසේ පවුලක් ජීවත් වෙනවා. වැඩිවිය පැමිණි ගැහැණු ළමයින් තුන් දෙනෙකුත්, ඒ අයගේ දෙමව්පියනුත්, එහි වැඩට සිටින ළමයෙකුත් යනාදී වශයෙන් හත් දෙනෙක් අඩි 14 × 8 ප්‍රමාණයේ පොඩි කැල්ලක ජීවත් වෙනවා. පොලීසිය මේ විධියට නියෝගයක් දුන්නේ කෙසේද ?

ඒ සම්බන්ධයෙන් ඒ විධියේ නියෝගයක් දෙන්නට බැරි බවත් මම පෙන්වන්නම්. ඒ සම්බන්ධයෙන් තඩුවක් නිකුත් කර තිබෙන්නේ, වත්තල පළාත් පාලන ආයතනයෙන් ප්ලෑනක් අනුමත නොකර බලහත්කාරයෙන් මේ ගෙය හැදුවාය කියායි. මේ ගෙය හැදීම ගැන මේ තැනැත්තිය වරදකාරියක් හැටියට නිකුත් කර තිබෙනවා. ඒ තඩු නිකුත් කර තිබෙන්නේ මෙපමණයි :

"මහෙස්ත්‍රාත් අධිකරණය,
වත්තල.

පැමිණිල්ලේ ශීර්ෂය : අතවසර ගොඩනැගිල්ලක් සෑදීම.

නඩු අංකය : ඒ. ඕ. බී. ද ඇස්. ගුණවර්ධන,
මහජන සෞඛ්‍ය පරීක්ෂක,
වත්තල — මාඛෝලේ නගර සභාව,
පැමිණිලිකරු.

ප්‍රතිවිරුද්ධව

එච්. ඩී. ආර්. ජොසප්ත්,
'වාර්ල්ටන්ස්', 277, පරණ නුවර පාර, දළුගම, කැළණිය.
විත්තිකරු.

මෙහි තිබෙන කරුණු සියල්ලක්ම මම තමුත්තාත්තේලාට කියවන්න යන්නේ නැහැ. මෙහි තිබෙන අයුක්තිය පෙන්වීමට කරුණු දෙක තුනක් පමණක් කියවන්නම්. "01.02.1985 දින තඩුකාරතුමා මේ නඩුවේ ඉදිරිපත් කර තිබෙන කරුණු අනුව මෙය බලහත්කාරයෙන් තොව ප්ලෑනක් නැතිව හැදීම ගැන ඔහු වරදකරු බව පිළිගනී. ඒ අනුව ඔහු වරදකරු කරනු ලැබේ."

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

ඔය සියල්ලක්ම සභාගත කරන්න. ඔය ඔක්කොම කියවන්නට යම්යොත් දවස් දෙකක් ගත වෙයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

එහෙම නම් මම මේ සියල්ලක්ම * සභාගත කරනවා. ඒ අනුව මේ ප්‍රශ්නය විසඳන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඊළඟට ඉදිරිපත් කළ යුතුව තිබෙන කාරණය මෙයයි : මම මේ ප්‍රශ්නය අහන්නේ ගරු ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙනුයි. මේකට පිළිතුරු දෙන්නට කවුරුන් ඉන්නවාද කියන්නට මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන්වත් මම පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. කොත්මලේ පුණ්‍යඵලය විවිධ සේවා සමුපකාර සමිතියේ ළඟදී පැවති නිලවරණය නීති විරෝධී බවට මට පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා. එකම පවුලේ තිදෙනෙකු මෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වී ඇති බව මට දන්වා තිබෙනවා. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යනාදී වශයෙන් සඳහන් වන තනතුරු තුනකට එකම පවුලේ තුන් දෙනෙක් නීති විරෝධීව තෝරාගෙන තිබෙනවාය කියන එක එක් චෝදනාවක්. ඒ වාගේම මෙහි වෙනත් දූෂණ, වංචා ඇති බවට මහජනයා මා වෙත කරුණු දැන්වා තිබෙනවා. ඉහත කී කරුණු ගැන විධිමත් පරීක්ෂණයක් වහාම පවත්වා මෙම සමිතියේ ආරවුල් විසඳීමට වහාම කටයුතු කොදන්නේද ? නොඑසේ නම් ඒ මන්ද ?

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සියළු කරුණු කියවන්නට යන්නේ නැහැ. පුත්ඩලුඔය විවිධ සේවා සමුපකාර සමිතියේ එල්. ඩී. නන්දසේන මහතා 27.02.85 දනම්න් ආහාර හා සමුපකාර ඇමතිතුමාට යවා ඇති ලියමනේ පිටපතක් මටත් එවා තිබෙනවා. මෙම සමුපකාර සමිතියේ හොඟ ගබඩාවේ හොරකම් රාශියක්ම පයුගිය කාලය තුළදී සිදු වී තිබෙනවා. මෙම ලිපියෙන් පෙන්වා දී තිබෙනවා එවැනි හොරකම් හා වංචා දහයක් ගැන. ඒ වැරදි වසා ගැනීම සඳහා කර තිබෙන්නේ, නීති විරෝධී ලෙස කාරක සභිකයන් පත් කර ගැනීමයි. එම නිසා නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා නම් එතුමා හෝ මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පිළිතුරක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ පිළිතුරක් දන් දෙන්නට බැරි නම්, මේ ගැන සොයා බලා පසුව පිළිතුරු දෙන හැටියට ඉල්ලා සිටිනවා. මෙය පිළිතුරු බලාපොරොත්තුවෙන් කල් දී ඇති ප්‍රශ්නයක්.

ඊළඟට මගේ ප්‍රශ්නය බදුල්ලේ බහු තාක්ෂණික ආයතනයේ සී. එස්. බණ්ඩාර රණවීර ශිෂ්‍යයාගේ ශිෂ්‍ය භාවය අවලංගු කිරීම ගැනයි. පාර්ලිමේන්තුවේදී මෙයට කලින් ඇසූ මේ ප්‍රශ්නයට අද වනතෙක් මට පිළිතුරු ලැබී නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

මේ ප්‍රශ්නය කලින් අසා තිබෙනවා නේද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

නමුත් මට තවමත් පිළිතුරු ලැබුණේ නැහැ. එම නිසා නැවත මතක් කිරීමකුයි කරන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

එකට උත්තර දෙයි.

* ප්‍රස්තකාලයේ තබා ඇත.
நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේදී මම මතු කළ වේලාවේදී, පාර්ලිමේන්තු කටයුතු භාර ඇමතිතුමා කිව්වා මෙක අදළ ඇමතිතුමාට දන්වා උත්තරයක් ලබා දෙන්නට ක්‍රියා කරනවාය කියා. කමුත් අද වනතුරුත් උත්තරයක් දුන්නේ නැහැ. මගේ මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දීර්ඝ විවාදයකුත් ගියා. උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා එද හිටියා. එතුමා සමඟ දීර්ඝ ලෙස වචන හුවමාරු කර ගන්නට සිද්ධ වුණා. එතුමා කිව්වා, දීර්ඝ ලෙස කථා කරන්නේ නැතුව ප්‍රශ්නය අසන්නටය කියා. ඒ පිළිබඳව හැන්සාඩ් වාර්තාවේ පළ වී තිබෙනවා. විශේෂයෙන්ම උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා සමඟ හුඟක් දුරට වචන හුවමාරුවක් සිද්ධ වුණා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

ඔය තරම් විස්තර කරන්නට වුවමනාවක් නැහැ. ප්‍රශ්නය අහන්න. උත්තරය දෙයි, නියෝජ්‍ය ඇමතිතුමා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

1984 නොවැම්බර් 19 වනද හැන්සාඩ් වාර්තාවේ 570 පිරුවේ සිට 575 පිරුව දක්වා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඇති වුණු වාද විවාද ගැන පළ වෙනවා. මේ ප්‍රශ්නය ගැන උත්තර පසුවදටම දෙන බව කිව්වා. නමුත් උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාට අද වනතුරුත් ඒට උත්තරයක් දෙන්නට බැරි වුණා.

ඊළඟට, උත්තර නොලැබුණු තවත් ප්‍රශ්නයක් මතු කරන්න කැමතියි. ප්‍රශ්නය මතු කර තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. මම දන් එය කියවන්නම් :

At Column 350 of Hansard of 24th January 1985 you will see the question I raised. I did not get a reply to it. The question is this :

"I wish to raise the following matter with the Hon. Minister of Labour at adjournment time of Parliament on 25.01.85 :

'Is the Hon. Minister aware that there is a massive backlog of applications to the Employees' Trust Fund sent by its members ? There are over 15,000 applications which have not been processed and the members are unable to obtain their dues. What action does the Hon. Minister propose to take to ensure that the members of the E.T.F. are paid their dues without delay ? '"

The point is this. When I raised this question the Hon. Minister of Labour assured me that he will reply, but so far he has not done so in Parliament. That is what I wish to say.

**අනිල් මූණසිංහ මහතා (මතුගම)**
**(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)**
(Mr. Anil Moonesinghe–Matugama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ප්‍රශ්න තුනක් අසා තිබෙනවා. එයින් දෙකක් යොමු කර තිබෙන්නේ අධ්‍යාපන ඇමතිතුමාටයි. මේ සුමානය තුළ මේ ප්‍රශ්නය මම දෙවරක් අසා තිබෙනවා. කනගාටුයි කියන්නට තවමත් උත්තරයක් ලැබුණේ නැහැ. ප්‍රශ්නයක් මතු කළාම ඒ ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන්නේ නැති නම් එය ලබා දීමට තමුන්නාන්සේගේ සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා. අඩු ගණනේ මේ සභාව තුළදී දෙන්නට බැරි නම්, පාර්ලිමේන්තු කටයුතු භාර ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්නට භාර ගන්නාට පසුව ඒ මාර්ගයෙන්වත් උත්තරයක් දන්වන ලෙස ඉල්ලා සිටිනවා. හොරවල මහා විද්‍යාලය ගැන මම සඳහන් කළා. ඇත්තෙන්ම බොහොම කනගාටුදායක තත්ත්වයකුයි තිබෙන්නේ. මේ විද්‍යාලය නාය යාමෙන් විනාශ වුණා. එම විද්‍යාලය වෙනත් තැනකට ගෙන යාම සඳහා වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් පිළිතුරක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟට මා සඳහන් කරන්නට යන මේ කාරණය ගැනත් අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. දන් පාසල් ශිෂ්‍යයන් රාශියක්ම පන්ති වර්ජනයක යෙදී සිටිනවා. මෙයින් සමහර ශිෂ්‍යයන් හදිසි නීතිය යටතේ සිර අඩස්සියට ගෙන තිබෙනවා. මගේ ප්‍රදේශයේ මතුගම නගරයේ ලොකු පාසල් 3 ක් තිබෙනවා. ඒ තුන්ම ශිෂ්‍යයින් පන්ති වර්ජනය කළා. එමෙන්ම නොයෙක් නොයෙක් ප්‍රදේශවල ශිෂ්‍යයින් පන්ති වර්ජනය කිරීම දවසින් දවස වර්ධනය වෙමින් පවතිනවා. මේ ගැන කරන්නට බලාපොරොත්තු වන්නේ මොකක්දැයි මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්නට කැමතියි. එයට අපි පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා ටිකකට කලින් නම් මෙහි සිටියා. එහෙත් දන් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දන් විශ්ව විද්‍යාලවලත් බොහොම අසීරු තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙනුත් කරන්නට යන්නේ මොනවාදැයි මම දැනගන්නට කැමතියි.

මෙන්න මේ ප්‍රශ්න තුන ඉදිරිපත් කරන්නයි, අද මම නැඟී සිටියේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Question No. 1 is addressed to the Hon. Prime Minister.

පූ. හා. 11. 18

**එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා (නියෝජ්‍ය මහාමාර්ග ඇමතිතුමා)**
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல — நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(Mr. S. W. Alawathuwala–Deputy Minister of Highways)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට මම ලැහැස්තියි. ලංකා වාතේ සංස්ථාවේ නිෂ්පාදනයන් අලෙවි කිරීමේ කාර්යය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට පැවරීමටත්, මෙතෙක් ලංකා වාතේ සංස්ථාවේ එකී කාර්යයන් සඳහා යොදවනු ලැබ සිටි කාර්ය මණ්ඩලයද ඒ සමගම ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට මාරු කිරීමටත් තීරණය කර ඇති බව දන්වමි.

ලංකා වාතේ සංස්ථාවේ නිෂ්පාදනයන් අලෙවි කිරීමේ කාර්යය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට පැවරීම නිසා ලංකා වාතේ සංස්ථාවට හෝ එහි සේවකයන්ට ගැටළු ඇතිවේ යයි සිතිය නොහැක.

දැනට පාඩු පිට පවත්නා ලංකා වාතේ සංස්ථාවේ කටයුතු පිළිබඳව පලාත් පාලන, තිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය අධ්‍යයනයක් කරගෙන යනු ලැබේ. එම අධ්‍යයනයෙන් අනාවරණය වන කරුණු අනුව සංස්ථාවේ ඉදිරි වැඩ කටයුතු පිළිබඳව සුදුසු ප්‍රතිපත්ති තීරණයන් ගනු ලබනවා ඇත.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් කරුණක් අහන්නට කැමතියි. යම් ආයතනයක සේවය කරන කෙනෙක් හදිසියේ වෙනමම ආයතනයකට පත් කරන විට අසාධාරණයක් වෙන්නේ නැත කියන එක පිළිගන්නට පුළුවන් දෙයක් නොවෙයි. ඒ සේවකයා බැදුණේ වාතේ සංස්ථාවටයි. ඒ සේවකයා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට මාරු කරන්නට කිසිම අයිතියක් නැහැ. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙනමම ස්ථාපිත ආයතනයක්. ඒ නිසා ඒ ආයාධාරණය තිවැරදි කරන්නය කියන එකයි, මගේ ඉල්ලීම. ඒ සේවකයාගේ කැමැත්ත අනුව ඔහුගේ වැටුපට හෝ වෙනත් යමකට බලපෑමක් නොවන අන්දමට ඔහු සිටින ආයතනයේම වෙනත් සේවා ස්ථානයක් ඔහුට දීමයි, සාධාරණය. එසේ නැතිව හිටි හැටියේම වෙනත් ආයතනයකට මාරු කරන්නට කිසිම නීතියක් නැහැ. කම්කරු අයිතිවාසිකම් අනුව හෝ වෙනත් නීතියක් අනුව හෝ එවැන්නකට ඉඩක් නැහැ.

**එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා**
**(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)**
(Mr. S. W. Alawathuwala)

පාඩු ලබන සංස්ථාවක් දිගටම පවත්වා ගෙන යන්නට පුළුවන් වන්නේ නැහැ. සමහරවිට මෙය පාඩු ලබන සංස්ථාවක් නිසා රැකියාව අහිමි වෙතවාට වඩා සහනදායක වන්නේ නැද්ද, ඒ සංස්ථාවෙන් තවත් සංස්ථාවකට එම තත්ත්වය උඩම මාරුවක් කිරීම ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

යම් ආයතනයක සේවයට බැඳුණු කෙනෙක් වෙනත් ආයතනයකට මාරු කරන්න බැහැ. එය ගරු නියෝජ්‍ය ඇමතිතුමා තේරුම් ගන්නට ඕනෑ. අදුන් පත්වීමක් තමි දෙන්නට පුළුවන්. එය වෙනම දෙයක්. ඒ නිසා මේ ගැන තවදුරටත් සොයා බලන්න. යම්කිසි නිලධාරියෙක් සෑපයූ පිළිතුරම කියවන්නේ කැතිව මේ ගැන තවදුරටත් සොයා බලන ලෙස මම ඉල්ලා සිටිනවා.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

ඒ ප්‍රශ්නයට දැන් පිළිතුරු දී තිබෙනවා. මිළඟට මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා (එම්. හලීම් ඉෂාක් මහතා) විසින් අසන ලද අතුරු ප්‍රශ්නයට දෙන්නට තිබෙන පිළිතුර මෙයයි. දැනටමත් සිමෙන්ති අලෙවිය පිළිබඳව " රිවෙල් ඩිලර්ස්ලා " කැඳවා සාකච්ඡා කර ඒ පදිළිබඳව විස්තරයක් පත්‍රයේ පළ කර තිබෙනවා. පත්‍රය බැලුවොත් ඒ ගැන දැනගන්නට පුළුවන්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

The next Question is addressed to the Hon. Minister of Justice.

ෂෙල්ටන් රණරාජ මහතා ( නියෝජ්‍ය අධිකරණ ඇමතිතුමා)
(திரு. ஷெல்டன் றணராஜா — நீதி பிரதி அமைச்சர்)
(Mr. Shelton Ranaraja–Deputy Minister of Justice)

මහරගම ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය පිළිබඳව කියන්නට තිබෙන්නේ මෙයයි. හම්බන්තොට උසාවියේ ඇති වී තිබෙන අර්බුදය සම්බන්ධව පැමිණිල්ලක් තිබෙනවා. ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අද විභාගයක් පවත්වනවා. ඒ විභාගයේ ප්‍රතිඵල අනික් රැස්වීමේදී මහරගම ගරු මන්ත්‍රීතුමාට මම දන්වන්නම්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්නේ එකම දෙයයි. අධිකරණයට මැදිහත්වීමට අමාරුකමක් තිබෙන බව ඇත්තයි. නමුත් දැනට මූලික අයිතියක් හැකිනි විදීමට ඉඩ නැතිව තිබිය දී නඩු විභාග කරමින් සමහර තීන්දු දීම ගැනයි, ප්‍රශ්නය තිබෙන්නේ.

ෂෙල්ටන් රණරාජ මහතා
(திரு. ஷெல்டன் றணராஜா)
(Mr. Shelton Ranaraja)

හම්බන්තොට නීතිඥ සංගමය දැන් විරෝධතයක් පවත්වා ගෙන යනවා. ඒ උදවිය උසාවියේ පෙති සිටින්නේ නැහැ. මං ඒ උදවිය උසාවියේ පෙති සිටීම වැලැක්වීමට කිසිවක් කර නැහැ. ඒ උදවියම විරෝධතයක් පවත්වාගෙන යනවා. එයින් අධිකරණයට කිසිම හානියක් වෙන්නේ නැහැ. ඒ අයට සම්පූර්ණ අයිතිවාසිකම් තිබෙනවා උසාවියේ පෙති සිටීමට.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

එක් නීතිඥයකුට උසාවියේ තර්ක කිරීමට තිබෙන අයිතිය නොදීමෙන් නීතිඥයන් හැටියට ඒ අයට තිබෙන අයිතියක් උල්ලංඝණය කිරීමක් සිදු වී තිබෙනවාය කියන හේතුව උඩයි නීතිඥ සංගමය ඒ තීරණය ගෙන තිබෙන්නේ. මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ සම්බන්ධව සොයා බලන ලෙසයි.

ෂෙල්ටන් රණරාජ මහතා
(திரு. ஷெல்டன் றணராஜா)
(Mr. Shelton Ranaraja)

ඔව්. ඒ සම්බන්ධව තමයි අද දින අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විභාගයක් පවත්වන්නේ.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

බද්දේගම ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙයයි :

බදුල්ල නගරයට ජලය සැපයීම සඳහා යෝජිත ගුරුත්ව යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ ගොවිතැට ජලය සැපයෙන අමුණට පහළින් ඇති ස්ථානයකිනි. මෙසේ ලබා ගන්නේ අමුණින් පිටාර ගලන අතිරික්ත ජලයයි. දැනට කර ඇති ඇස්තමේන්තු අනුව අවුරුද්දේ බොහෝ මාස වලදී දිනකට වතුර ගැලුම් මිලියන් ලක්ෂය බැගින් බදුල්ල නගරයට ලබාදිය හැකිවේ. තද ඉඩෝරයකදී අමුණින් පිටාර ගලන වතුර ප්‍රමාණය අඩු වුවහොත් වෙනත් ස්ථානයකින් දැනට මෙත් පොම්ප කිරීමේ ක්‍රමය මගින් බදුල්ල නගරයට ජලය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

මෙම ගුරුත්ව යෝජනා ක්‍රමයෙන් ජලය ලබා ගැනීමට අදහස් කර ඇත්තේ පොම්ප ක්‍රියාත්මක කිරීමේදී දැරීමට සිදුවන අධික වියදම් අඩුකර ගැනීමේ පරමාර්ථයෙනි. ගුරුත්ව යෝජනා ක්‍රමය අනුව අතිරික්ත ජලය ප්‍රයෝජනය සඳහා යොදු ගැනීමට ද ඉඩ සැලසේ.

මේ අනුව ගුරුත්ව ජල යෝජනා ක්‍රමය මගින් බදුල්ල නගරයට ජලය සැපයීමේදී ගොවීන් විසින් පරිහරණය කරන ජල අවශ්‍යතාවයන්ට කිසිදු බාධාවක් ඇති නොවන බැව් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති වාර්තා කර තිබේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Reply to question raised regarding the residents in the land belonging to St. Barbara's Church, Ialahena, Negombo.

මම ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නයි ඉස්සෙල්ලා කිව්වේ. වෙනත් ප්‍රශ්නයකටයි උත්තර දුන්නේ. කමක් නැහැ. ඒ ප්‍රශ්නයත් මෙතැන තිබෙනවා. දැන් ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

ප්‍රශ්නය අංක කීයද සභාපතිතුමනි,

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

අංක 3.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

කොළඹ ආච් බිෂොප්තුමාට හිමි දේපළවලින් නිවාස දෙපළ උපරිම නීතිය යටතේ මිගමුව සාන්ත බාබරා දේවස්ථානය භාරයේ පවතින නිවාස 09 ක් ආච් බිෂොප්තුමාගේ ප්‍රකාශනය පරිදි පැවරී ඇත.

මෙම පැවරීමට අතතුරුව අදලව ඉඩමේ තවත් නිවාස 35 ක් පමණ තනා ඇති බව නිවාස දෙපාර්තමේන්තුව විසින් කරන ලද මැනීම අනුව පැහැදිළි වේ.

සාන්ත බාබරා දේවස්ථානයේ දේවගැතිතුමා ජාතික නිවාස කොමසාරිස් හමුවේ මෙම ඉඩමේ පදිංචි අයවලුන් වෙනත් කොටසක පදිංචි කර ඉඩම හිස්කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් කර පදිංචිකරුවන් විමසන ලද අතර එයට පදිංචිකරුවන් විරුද්ධ වන බැවින් එම ඉල්ලීම ඉටුකළ නොහැකි බව දේවගැතිතුමාට දන්වන ලදී.

එම ඉඩමේ පදිංචි අය ඉවත් කිරීමේ ප්‍රශ්නයක් ඒ අනුව පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Reply to question addressed to the Hon. Minister for National Security regarding eleven undergraduates at the Ruhunu Campus.

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I will bring it to the notice of the Hon. Minister. That is all I can say.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

The hon. Member for Akmeemana raised a question regarding the closure of the Match Factory, Walahanduwa Group, Galle.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙයයි :

මෙම කර්මාන්තශාලාව 1980 දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ ක්‍රියාත්මක වුණු අතර පසුව රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලදී. මෙම කර්මාන්තශාලාව ක්‍රියාත්මක කිරීම ආර්ථික වශයෙන් අවාසිදායක බව සංස්ථාවට පෙනී ගිය නිසා නිෂ්පාදන කටයුතු වර්ෂ කීපයක කාලයක සිට අත්හිටුවා තිබුණි.

ක්‍රියාත්මක නොවන අලාභදායකවූ ප්‍රාදේශීය සංවර්ධන යෝජනා ක්‍රමවලට අයත් සියළු ව්‍යාපෘතීන්ගේ වත්කම් රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය දෙපාර්තමේන්තුවල අවශ්‍යතා සහ විවිධසේවා සමුපකාර යම්තම් සඳහා අය කිරීමක් රහිතව පවරා දිය යුතු යයි අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබේ. වලහන්දුව ඕනිකුරු කම්හල සම්බන්ධයෙන් මෙම තීරණය අනුගමනය කරමින් එහි පාවිච්චියට නොගෙන තිබුණු යන්ත්‍රෝපකරණ රත්නපුර දිසාපතිගේ භාරයට රත්නපුර දිසා ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි පවරන ලදී. එසේ පැවරූ පසු ඒවා කොලොන්න සංවර්ධන සමුපකාර සමිතිය විසින් ක්‍රියාත්මක කරන ගිනිපෙට්ටි කර්මාන්තශාලාවක් වැඩිදියුණු කිරීම සඳහා යෙදීමට අදහස් කරන බවද රත්නපුර දිසා ඇමතිතුමා සඳහන් කර තිබුණි. මෙම ඉල්ලීම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලදී.

මෙම කර්මාන්තශාලාව වර්ෂ කීපයක කාලයක සිට ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණ හෙයින් මෙහි සඳහන් යන්ත්‍රෝපකරණ වෙනත් ආයතනයකට පැවරීමේ හේතුවෙන් විශාල පිරිසකට රැකියාව අහිමිවියයි කීම කාවැද්දෑය.

මෙම කම්හල වසා දමා ඇත්තේ ඉහත සඳහන් කළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුවය.

ආර්ථික වශයෙන් පාඩුවට ක්‍රියාත්මක වෙමින් තිබූ මෙම කම්හල නැවත විවෘත කිරීමේ ප්‍රශ්නයක් පැන නොනගී.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரண)**
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් අසන්න තිබෙනවා. මම ඇසූ ප්‍රශ්නය මෙයයි. මෙම කම්හල තිබුණේ ගාලු දිස්ත්‍රික්කයේ අක්මීමන ආසනයෙයි. පළාතේ මන්ත්‍රීවරයාටත් ගරු දිසා ඇමතිතුමාටවත් නොදන්නවා එම කම්හල එතැනින් ගලවා ගෙන ගොස් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, කම්කරුවන් සංඛ්‍යාවකට රැකියා අහිමි වුණා යයි කීම කාවැද්දෑයි කියා. එතුමාගේ පිළිතුරේ සඳහන් වුණ කාරණය අසත්‍ය කාරණයක් බව මම මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා. අක්මීමන ආසනයේ කම්කරුවන් එකසිය තිස් ගණනක් මේ කම්හලේ වැඩ කළා. මේ කම්හල තිකම්ම පවත්වා ගෙන ගියේ නැහැ. කම්කරුවන් 130 කට වැඩි පිරිසක් එහි වැඩ කළා. අද ඒ සියලු දෙනාම කිසිම රැකියාවක් නැතිව සිටිනවා. එම නිසා රැකියා අහිමි වුණ සියලු දෙනාටම නැවත රැකියා ලබා දීම සඳහා නැවත වරක් මේ කම්හල විවෘත කරන්නය කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. පාලනයේ තිබුණු වැරදි නිසයි මේ කම්හලෙන් පාඩු සිදු වුණේ. කොලොන්නට ගෙන ගිය විට ලාභ ලැබෙන්නත් මෙහිදී අලාභ වෙන්නත් හේතුවක් නැහැ. එම නිසා මේ කම්හල අක්මීමන ආසනයට නැවත ලබා දෙන්නය කියා මා තමුන්නාන්සේගෙන් මේ ගරු සභාවේදී ඉල්ලීමක් කරනවා. අද එහි සේවය කළ අසරණ කම්කරුවන් රැකියාවල් නැතිව ගෙවල්වලට වී සිටිනවා. ඔවුන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. කම්හලේ වැඩ කළ නිසා ඔවුන්ගේ ආහාර මුද්දරත් කපා දමා තිබෙනවා. ඒ නිසා මා ඉතා කරුණාවෙන් හා ගෞරවයෙන් තමුන්නාන්සේට කියා සිටිනවා මේ තිලධාරී මහත්වරුන් වීසින් එවා තිබෙන වැරදි සහිත අසත්‍ය පිළිතුරෙන් මම සෑහීමට පත් නොවන බව. ඒ නිසා නැවත වරක් මේ කම්හල විවෘත කර දෙන මෙන් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව කථාවක් පවත්වන්නට උත්සාහ කිරීම ගැන මා කෘතගුරු වෙනවා. කොහොම වුණත් මේ පිළිතුරේ සඳහන් වෙනවා මේ කම්හල ප්‍රතිඵලදායක නැති තත්ත්වයෙන් පවත්වාගෙන ගිය නිසා කාලයක් තිස්සේ වසා දමා තිබුණාය කියා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரண)**
(Mr. Richard Pathirana)

එය වසා දැමීමේ මැතකදීයි. මෙම කම්හල අරගෙන යන්න තිබුණ වුවමනාව නිසාමයි වසා දැමීමේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

The question raised with the Hon. Prime Minister regarding Mrs. H. D. R. Josephine of Kelaniya.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙයයි :

එච්. ඩී. ආර්. ජොසෆින්, " වාල්ස්ටන් ", අංක 277, පරණ නුවර පාර, කැළණිය යන ස්ථානයේ පදිංචිව සිටින නිවසේ කොටසක් බලගත්කාරයෙන් තීන් වරෝටිව කඩා දැමීමක් ගැන ජාතික නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුවට කිසිම පැමිණිල්ලක් ලැබී නැත. පැන නොනගී පැන නොනගී පැන නොනගී

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන හැටියට එතුමා මේ පිළිතුර සපයන්නේ කිසිම යොයා බැලීමක් කරන්නෙ නැතිවයි. මම පැහැදිලිව ප්‍රශ්නය ඉදිරිපත් කළා. ඇත්තවශයෙන්ම නියම විධියට උත්තරයක් දෙන්න බැරි නම් ඒ උත්තරය නොදී සිටීම වඩා හොඳයි කියා මා හිතනවා. විශේෂයෙන්ම ගරු අගමැතිතුමාගේ අමාත්‍යාංශයට අයිති පිළිතුරක්. ගරු අගමැතිතුමා නම් කවදාවත් ඔය විධියේ ලිපියක් කියවන්නෙ නැහැ. තමුන්නාන්සේ ඔය ලිපිය කියවීම ගැන මම පුදුම වෙනවා. මම පැහැදිලි කර දුන්නා ලිපි ලේඛණ ආදිය ඉදිරිපත් කරමින් නියම විදියට. ලිපිගොනුවේ අංකයත් දුන්නා. එතුමා කියා තිබෙනවා මේ ගෙය කඩන්න බැහැ, එහි අයිතියක් ඒ අයට තිබෙනවා කියා. ඒ ගැන විභාගයක් කර ඒක කියලා තීරණයක් දී තිබෙනවා. තමුන්නාන්සේ කියනවා එහෙම එකක් නැහැ කියා. කවිද දුන්නෙ ඔය ලේඛණ ? ඔහොමද උත්තර දුන්නෙ පාර්ලිමේන්තුවේ. ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

නිවාස අධිකාරියයි, නිවාස කොමසාරිසුයි කියා දෙදෙනෙක් ඉන්නවා. මෙහි ලිපි අංකය ජාතික නිවාස කොමසාරිස්ගේ ගෙ.කු.ප.5/3/2/විවිධ කියන එකයි. ඒ ලිපි අනුවයි මේ පිළිතුර දුන්නෙ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ ජාතික නිවාස අධිකාරියයි, කොමසාරිස්තුමා තමයි විභාගකර තියම කර තිබෙන්නෙ. එතුමා රෙන්ට් කොන්ට්‍රෝල් බෝඩ් එකටත් කියා තිබෙනවා එහි තීරණය වැරදිය කියා. එතකොට මේක නඩුවට උසාවියට ඉදිරිපත් කරලත් තියෙනවා. ඒ ගැන ලිපි ලේඛන තිබෙනවා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙත් ඉල්ලනවා මේ විදියට, ළාමක විදියට, ප්‍රශ්නයකට උත්තර දෙන්නේ නැතුව ඒ ප්‍රශ්නය හොඳට බලා උත්තරය දෙන්නය කියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ අවසරය පරිදි මම ඒ ප්‍රශ්නය සභාගත කළා. ඒ අනුව යොයා බලා සම්පූර්ණ පැහැදිලි උත්තරයක් මට ඉදිරිපත් කරන්න.

එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා
(திரு. எஸ். டபிள்யு. அலவத்துவல)
(Mr. S. W. Alawathuwala)

පැහැදිලි උත්තරයක් දී තිබෙනවා. ඒකෙ තේරුමක් නැත්නම් අපි තවදුරටත් උත්තරයක් ඉදිරිපත් කරන්නම්, පසුව.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

There is a question regarding the Employees' Trust Fund raised with the Hon. Minister of Labour !

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
කවුරුවත් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Reply has to be given to question raised with the Deputy Minister of Higher Education regarding student C. F. Bandara Ranaweera of the Badulla Polytechnic.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

No one is there to answer the questions. The Hon. Minister of Parliamentary Affairs and Sports should answer.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I can bring the matters to their notice.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

On other days you used to undertake everything.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I did not undertake to reply. I said that I will bring them to their notice.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

All the other Ministers are not present. When we raise a question there must be somebody to answer.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I will bring them to their notice. That is all I can do.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Then there is the question raised about the MPCS of Pundaluoya.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I think this js wrong procedure. We are raising questions and there is no one to answer.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

The hon. Member for Matugama raised a question from the Deputy Minister of Higher Education regarding a University.

**අනිල් මූණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

He is missing.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Then there is a question raised with the Hon. Minister of Youth Affairs and Employment and Minister of Education regarding the students on strike at Horawala Maha Vidyalaya, Kalutara District. I think the Hon. Minister of Parliamentary Affairs and Sports should kindly bring these matters to the notice of the Ministers concerned so that they can answer them.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*விஞ வினுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව ප.ව. 11.35 ට 1985 මාර්තු 21 වන බ්‍රහස්පතින්ද ප.ව. 10 තෙක් සඳල් කියේය.*

*அதன்படி, மு. ப. 11.35 மணிக்கு பாராளுமன்றம், 1985 மார்ச் 21 வியாழக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 11.35 a.m until 10 a.m. on Thursday, 21st March, 1985.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සංශෝධන කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මේ පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1985 මාර්තු 22 වන සිකුරාදා

හෝඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1985 மார் 22, வெள்ளிக்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

not later than

**Friday, 22nd March 1985**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 9.30 a.m. to 11.35 a.m. on 08.03.1985** |
| **Final set of manuscripts received from Parliament** | : | **5.45 p.m. on 08.03.1985** |
| **Printed copies despatched** | : | **09.03.1985 afternoon** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දයක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දයක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දුට ප්‍රථම දයක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දයකත්වය ඉබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දයක ඉල්ලුම්පෑ භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வொராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී